වාර්ෂික වාර්තාව

2024

1990 සුවසැරිය පදනම

පටුන

1. **මෙහෙවර, දැක්ම සහ පරමාර්ථය** 2
2. **ආයතනික තොරතුරු** 3
3. **සභාපතිතුමාගේ පණිවුඩය** 5
4. **අධ්‍යක්ෂකවරුන්ගේ කෙටි විස්තරය** 6
5. **ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ වාර්තාව** 9
6. **ආයතනික පාලන වාර්තාව** 10
7. **විගණන කමිටු වාර්තාව** 11
8. **මෙහෙයුම් කාර්යසාධනය** 13
9. **මූල්‍යමය ක්‍රියාකාරීත්වය** 22

1. මෙහෙවර, දැක්ම සහ පරමාර්ථය

1990 සුව සැරිය පදනමේ මෙහෙවර, දැක්ම සහ පරමාර්ථය, ***"ජීවිතයක් සුරැකීම"*** යන එකම අභිමතාර්ථය පමණක් පෙරදැරි කරගෙන ස්ථාපනය කර ඇති අතර තවදුරටත් සිදුවන සංවර්ධන කටයුත්තක් හෝ වැඩි දියුණු කිරීමක් සිදුවන්නේ තවත් ජීවිත බේරා ගන්නේ කෙසේද යන්න මත පදනම්වය.

2. ආයතනික තොරතුරු

නෛතික රාමුව

2018 ජූලි මස 4 වන දින රජය විසින් 1990 සුව සැරිය පදනම පිහිටුවීම සඳහා අවශ්‍ය ගැසට් පත්‍රය ගැසට් කරන ලද අතර එය 2018 අංක 18 දරන පාර්ලිමේන්තු පනත මගින් බලාත්මක කරන ලදී.

ලියාපදිංචි කාර්යාලය

අංක. 415, කෝට්ටේ පාර, රාජගිරිය, ශ්‍රී ලංකාව

අධ්‍යක්ෂක මණ්ඩලය

පත් කරන ලද අධ්‍යක්ෂවරුන්

2025.01.03 සිට වසර 3ක කාලය (2025 - 2028)

නිරෝෂන් රත්නායක මහතා - සභාපති

වෛද්‍ය අරුණ පාලිත සම්පත්

නලින් ආර් පෙරේරා මහතා

ෂර්වින් අර්සකුලරත්න මහතා

2024.08.08 දිනෙන් අවසන් වූ වසර 3ක (2021 - 2024) සහ 2024.08.11 - 2024.12.31 කාල සීමාව

දුමින්ද්‍ර රත්නායක මහතා - සභාපති

සන්ධ්‍යා සල්ගාදු මහත්මිය

මහාචාර්ය අසිත ද සිල්වා මහතා

විශ් ගෝවින්දසාමි මහතා

නියෝජිතයන්

නිල බලයෙන් පත් වූ මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ නියෝජිත

: අරුණ කුරුම්බලපිටිය මහතා (2024.11.25 දක්වා)

තරිඳු කාරියවසම් මහතා (2024.11.26 සිට)

නිල බලයෙන් පත් වූ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ නියෝජිත

: වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා (2024.08.26 දක්වා)

නිල බලයෙන් පත් වූ පොලිස්පතිවරයාගේ නියෝජිත

: නියෝජ්‍ය පොලිස්පති ඉන්දික හපුගොඩ මහතා

විගණකවරුන්

විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

බැංකු

ලංකා බැංකුව, ආයතනික ශාඛාව

ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්

ප්‍රධාන විධායක නිලධාරී	:	සොහාන් ද සිල්වා මහතා
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	:	වෛද්‍ය ශ්‍රීලාල් ද සිල්වා
මානව සම්පත් සහ පරිපාලන ප්‍රධානී	:	චාමර ද අල්විස් මහතා
පුහුණු සහ ප්‍රොටෝකෝල ප්‍රධානී	:	ගයාන් චතුරංග මහතා
හදිසි අණ සහ පාලන මධ්‍යස්ථාන (ECCC) ප්‍රධානී	:	මිරාජ් විජේසේකර මහතා
මූල්‍ය සහ සැපයුම් දාම (SCM) කළමනාකරු	:	අශාන් පෙරේරා මහතා
මෙහෙයුම් කළමනාකරු	:	සචිරු රත්නායක මහතා
ප්‍රවාහන කළමනාකරු	:	රෝහණ වීරසිංහ මහතා
තත්ත්ව පාලන කළමනාකරු	:	රුවන් කුමාරසිරි මහතා
පුහුණු සහ ප්‍රොටෝකෝල කළමනාකරු	:	ස්ටැනෝසන් සෙල්වරාජා මහතා
පරිපාලන සහ ආයතනික සේවා කළමනාකරු	:	රෂිකා රොද්‍රිගෝ මහත්මිය
ප්‍රාදේශීය කළමනාකරුවන්	:	ගාමිණී කුමාර මහතා සහ කේ. තවකාන්තන් මහතා

3. සභාපතිතුමාගේ පණිවුඩය

SUWA SERIYA FOUNDATION

Established by Act of Parliament No. 18 of 2018

නව අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ධුරය දරමින් 1990 සුව සැරිය පදනමේ 2024 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ඉහමත් ගෞරවයක් ලෙස සලකමි.

පූර්ව රෝහල් සේවාවක් ලෙස දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක් පුරාම ව්‍යාප්ත වූ 1990 සුව සැරිය හදිසි ගිලන් රථ සේවාව නවීන තාක්ෂණයත් සමග වඩාත් ගුණාත්මකව ඉහල තලයකට ගෙන ඒමට තම උපරිම දායකත්වය ලබාදෙමින් කැපවුන පෙර සිටි අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට මාගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමි. තවද අප කාර්යාල කාර්ය මණ්ඩලයට හා විශේෂයෙන්ම ගිලන් වූ ජීවිතයක් බේරාගැනීම වෙනුවෙන් දිවා/රාත්‍රී මහත් කැපවීමකින් විශිෂ්ඨ මෙහෙවරක් ඉටුකරමින් කටයුතු කරන අපගේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයටද, ඔවුන්ගේ විශිෂ්ඨ සේවය වෙනුවෙන් මාගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමි.

2024 වසර තුල රටේ පැවති දැඩි ආර්ථික අර්බුදකාරී තත්වයන් හමුවේද, විශේෂයෙන්ම කාර්ය මණ්ඩල හිඟකම වැනි අර්බුදකාරී තත්වයන් හමුවේද, 1990 සුව සැරිය පදනමේ කාර්ය මණ්ඩලය "ජීවිතයක් බේරාගැනීමේ" මෙහෙවර නොසැලී ඉදිරියට ගෙන ගොස් ඇත. එමෙන්ම 2024 වසර තුල අපගේ කණ්ඩායම රටපුරා හදිසි අවස්ථාවන් මිලියන 02 කට වඩා ප්‍රතිචාර දැක්වීමේ කඩඉම පසු කර ඇති අතර, එය 1990 සුව සැරිය පදනම විසින් ඉටුකරන ලද සේවාවේ සුවිශේෂී සංධිස්ථානයකි. ඒ හරහා රටපුරා ජනතාව වෙත අප විසින් ලබාදෙන හදිසි ගිලන්රථ සේවය රටේ ජනතාවගේ ඉමහත් පැසසුමට මෙන්ම ගෞරවාදරයට පත්වී ඇත.

තවද කැළණිය විශ්ව විද්‍යාලය සමඟ ආරම්භ කරන ලද හදිසි වෛද්‍ය තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරීමේ පාඨමාලාව හරහා අපගේ ශ්‍රම බලකාය තවදුරටත් ශක්තිමත් කිරීමට හැකියාව ලැබී ඇති අතර, එමගින් වඩාත් කාර්යක්ෂම හා ඔරොත්තු දීමේ හැකියාවක් සහිත පූර්ව රෝහල් හදිසි සත්කාරක කණ්ඩායමකින් සමන්විත පද්ධතියක් ගොඩනැගීමට හැකිවී ඇත.

තවද මෙම වසර තුල ලෝක බැංකුව විසින් 1990 සුව සැරිය ජාතික හදිසි ගිලන්රථ සේවය කාර්යක්ෂම ලෙස ප්‍රතිචාර දක්වන්නා වූ රාජ්‍ය සේවයක් බවට ඉහල පිළිගැනීමක් කර ඇත. මෙම පිළිගැනීම අපගේ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම ඉමහත් ගෞරවයක් ගෙන දෙන අතර, ඔවුන්ගේ කැපවීම, උනන්දුව මෙන්ම කාර්යක්ෂමතාවය වැඩිදියුණුවීමට ද එය ඉවහල් වී ඇත. එය රාජ්‍ය ආයතනයක් ලෙස අප ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි. ඒ සඳහා 1990 සුව සැරිය කාර්ය මණ්ඩලය නිසි කළමණාකරනයකින් යුතුව මෙහෙයවමින් පදනම වෙනුවෙන් තම සේවය කාර්යක්ෂමව හා දැඩි කැපවීමකින් ඉටුකරමින් දැවැන්ත කාර්යභාරයක් කරමින් සිටින ප්‍රධාන විධායක නිළධාරී හටද මාගේ ගෞරවණීය ස්තුතිය පුදකරමි.

"ජීවිතයක් බේරාගැනීමේ" අපගේ සුවිශේෂී හදිසි පූර්ව රෝහල් සත්කාරක මෙහෙවර සුවහසක් ශ්‍රී ලාංකික ජනතාව වෙත වඩාත් ඵලදායී හා කාර්යක්ෂමව තවදුරටත් පුළුල් කරමින් 1990 සුව සැරිය ජාතික හදිසි ගිලන්රථ සේවාව ඉහල තලයකට රැගෙන යෑමේ පොදු අරමුණ සඳහා නව නායකත්වයක් සමඟ කැපවී ක්‍රියා කිරීමට සියළු දෙනාම එක්වෙමු.

1990 සුව සැරිය පදනම

CHAIRMAN
1990 SUWA SERIYA FOUNDATION

නිරෝෂන් රත්නායක
සභාපති

In case of Emergency: T: 1990 | +94 11 204 5801

Official Address (Head Office): 415, Kotte Road, Rajagiriya, Sri Lanka | T: +94 11 217 4829 | e: info@1990.lk

4. අධ්‍යක්ෂකවරුන්ගේ කෙටි විස්තරය

නිරෝෂන් රත්නායක මහතා

මේජර් (විශ්‍රාමික) නිරෝෂන් රත්නායක මහතා 1994 සිට 2019 දක්වා කාලය පුරා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දී විශිෂ්ට සේවා වාර්තාවක් සහිතව සේවය කල අති පළපුරුදු නිලධාරියෙකි. පාබල හමුදා මෙහෙයුම් සහ හමුදා බුද්ධි සේවා විශේෂඥයෙකු වන ඔහු, කණ්ඩ භාර නිලධාරී, කණ්ඩායම් භාර නිලධාරී අණදෙන, සහ බලසේනා මේජර් වැනි විශේෂිත විධාන හා කාර්ය මණ්ඩල තනතුරු රාශියක් දරනු ලැබීය. ඔහු ශ්‍රී ලංකාව තුළද විදේශයන්හිද උසස් පුහුණු පාඨමාලා සම්පූර්ණ කර ඇති අතර, වන්නි මානුෂීය මෙහෙයුම දී දැක්වූ වීරත්වය සඳහා වීර වික්‍රම විභූෂණ, රණ වික්‍රම සහ රණ ශූර යන පදක්කම් ලබා ඇත. ඔහු යුද්ධ හමුදා සේවය අවසන් වූ පසු, පෞද්ගලික ආරක්ෂක ක්ෂේත්‍රයේ නායකත්ව තනතුරුවලට පිවිසුණේය.

වෛද්‍ය අරුණ පාලිත සම්පත් මහතා

වෛද්‍ය අරුණ පාලිත සම්පත් මහතා වර්තමානයේ ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේ සේවය කරන පළපුරුදු වෛද්‍යවරයෙකි. ඔහු 2004 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබාගෙන ඇති අතර, එතැන් සිට වෘක්කවේදී, මහජන සෞඛ්‍ය සේවා සහ වෛද්‍ය ඒකක නායකත්වය ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශේෂිත තනතුරු රාශියක් දරනු ලැබීය. වසර 20 කට වැඩි සේවා කාලයක් සමග ඔහු වෘත්තිය සෞඛ්‍ය හා ආරක්ෂාව සඳහා සහ, සෞඛ්‍ය සේවා ගුණාත්මකභාවය හා ආරක්ෂාව සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකාරක ලෙසද කටයුතු කර ඇත. කොවිඩ්-19 වසංගත කාලය තුළ ඔහු දිස්ත්‍රික් මට්ටමින් රෝගී ප්‍රවාහනය, පරීක්ෂණ සහ එන්නත්කරණ කටයුතු ආදිය සංවිධානය කිරීමේ දැවැන්ත භූමිකාවක් ද සම්පූර්ණ කළේය.

නලින් ආර්. පෙරේරා මහතා

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධියක් ලබා වසර 19කට අධික කාලයක් නීති ක්ෂේත්‍රයේ විශිෂ්ට සේවයක් සපයමින් සිටින නලින් ආර්. පෙරේරා මහතා පළපුරුදු නීතීඥවරයෙකි. ඔහුට නඩු පැවරීම, නීති උපදේශනය සහ උපදේශන සේවා ආදී ක්ෂේත්‍රවල විශ්වාසනීය වාර්තාවක් ඇත. 12,000කට අධික ඔප්පු සකසන ලද පළපුරුදු ප්‍රසිද්ධ නොතාරිස් සහ දිවුරුම් කොමසාරිස්වරයෙකු ලෙසද ඔහු කටයුතු කරයි. කම්කරු නීතිය, ව්‍යාපාරික නීතිය සහ අනුකූලතා ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනීම මත, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඇතුළුව රාජ්‍ය හා පුද්ගලික ආයතන රැසකට විශ්වාසවන්ත නීති උපදේශකයෙකු ලෙස ඔහු සේවය කරයි.

ෂර්වින් අර්සකුලරත්න මහතා

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණකාධිකාරි (ගෞරව) උපාධියක් හැදෑරූ ෂර්වින් අර්සකුලරත්න මහතා, ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විශාල අත්දැකීම් සහිත පුද්ගලයෙකු වේ. ඔහු ජපානයේ ඔසාකා නගරයේ ගාර්බෝ සංස්ථාවෙහි විධායක සේවයේ ද, ගාටෙක්ස් ඉන්ඩස්ට්‍රීස් ලංකා පුද්ගලික සමාගමෙහි විධායක අධ්‍යක්ෂ තනතුර ද දරන ලදී. එමෙන්ම, රුවි ක්ලෝතින් පුද්ගලික සමාගමෙහි සභාපති/කළමනාකරු ලෙසද ඔහු කටයුතු කරයි.

දුමින්ද රත්නායක මහතා

දුමින්ද රත්නායක මහතා විද්‍යාවේදී (ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු) උපාධියක් ලබා ඇති අතර, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකි. ඔහු සෙල්ටෙල් / ටීගෝ හා එටිසෙලාට් සමාගම්හි හිටපු ප්‍රධාන විධායක නිලධාරියා වන අතර ආයතන සහ පුද්ගලික සමාගම් කිහිපයක අධ්‍යක්ෂක මණ්ඩල තනතුරුවල කටයුතු කරයි. මීට අමතරව, ඔහු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති තනතුර ද දරා ඇත. 2018 වසරේ දුමින්ද මහතා 1990 සුව සැරිය පදනමේ ආරම්භක සභාපතිවරයා ලෙස පත් වූ අතර, පදනම මෙරට වඩාත් කාර්යක්ශම රාජ්‍ය ආයතනයක් බවට කළමණාකරනය කරමින් මෙහෙයවන ලදි.

විද්‍යා ජ්‍යෝති මහාචාර්ය. අසිත ද සිල්වා මහතා

මහාචාර්ය අසිත උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබා ඇති අතර ඔක්ස්ෆර්ඩ්හි රැඩ්ක්ලිෆ් රෝහලේදී සායනික ඖෂධවේදය පිළිබඳ පශ්චාත් උපාධි පුහුණුව ලබා ඇත. මහාචාර්ය අසිත කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සායනික ඖෂධවේදියකු සහ ඖෂධවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු වන අතර කැලණිය විශ්වවිද්‍යාලයේ සායනික පරීක්ෂණ ඒකකයේ අධ්‍යක්ෂවරයා ද වේ. එසේම ඔහු ලන්ඩනයේ රාජකීය වෛද්‍ය විද්‍යාලයේ සාමාජිකයෙකි. ඔහු New England Journal of Medicine, Lancet, JAMA, Clinical Science and Stroke සහ PLoS Medicine වැනි බොහෝ විද්‍යාත්මක සඟරා හි ලිපි ප්‍රකාශයට පත් කර ඇත. 2019 දී මහාචාර්ය අසිත විද්‍යාවට කළ වටිනා දායකත්වය වෙනුවෙන් ජාතික ගෞරව විද්‍යා ජ්‍යෝති සම්මානයෙන් පිදුම් ලැබිය.

සන්ධ්‍යා සල්ගාදු මහත්මිය

සන්ධ්‍යා මහත්මිය කැලණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය සහ ඕස්ට්‍රේලියාවේ එඩිත් කෝවන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA-ජාත්‍යන්තර) ලබා ඇති අතර, එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකාවක් (MCIM) ද වේ. Ogilvy Action හි අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිණිය ලෙස සේවය කර ඇති සන්ධ්‍යා මහත්මිය ලෝක බැංකු අරමුදල් සපයන ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති රැසකට ඉමහත් දායකත්වයක් ලබා දී ඇති පළපුරුදු සන්නිවේදන විශේෂඥවරියක් සහ ව්‍යාපාරික උපදේශකවරියකි. 2018/19 හි Women in Management, IFC, සහ Australian Aid විසින් ප්‍රදානය කරන ලද “Woman of Inspiration” ඇතුළු බොහෝ පදවි නාමවලින් ගෞරවයට පාත්‍ර වී ඇත. දැනට, ඇය ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA)/ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශකවරියක් ලෙස සේවය කරයි.

විශ් ගෝවින්දසාමි මහතා

විශ් මහතා විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ හාට්ෆෝඩ් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA) ලබා ඇත. ලංකා වානිජ මණ්ඩලයේ සභාපති, ලංකා සේවා යෝජකයින්ගේ සම්මේලනය, ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ කවුන්සිලයේ සභික, වෙළඳ සේවා අර්ථසාධක සංගමයේ කමිටු සාමාජික, ශ්‍රී ලංකා ඖෂධ කර්මාන්ත මණ්ඩලයේ හිටපු සභාපති යනාදී ලෙස ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විවිධ තනතුරු දරා ඇත. කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉන්දු ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු සභාපතිවරයා ද වේ. දැනට විශ් මහතා සන්ෂයින් හෝල්ඩින්ග්ස් පී.එල්.සී (CSE•SUN), වටවල වැවිළි සමාගම, වටවල කිරි නිෂ්පාදන සමාගම, සන්ෂයින් විල්මා පෞද්ගලික සමාගම, ටාජ් ලංකා හොටෙල්ස්, සහ සොෆ්ට්ලොජික් ජීවිත රක්ෂණ සමාගමෙහි හි අධ්‍යක්ෂ/සභාපති ධූර දරයි.

තරිඳු කරියවසම් මහතා

තරිඳු කරියවසම් මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කැපවුණු නිළධාරියෙකි. ඔහුට මහජන පරිපාලන ක්ෂේත්‍රයේ වසර දහයකට වඩා වැඩි පළපුරුද්දක් ඇත. වර්තමානයේ ඔහු විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මූල්‍ය හා සංවර්ධන සහයෝගිතාව කළමනාකරණය කිරීමේ විශේෂ භූමිකාවක් ඉටු කරයි. මෙයට පෙර ඔහු ඉඩම් අමාත්‍යාංශයේ නියෝජ්‍ය කොමසාරිස් සහ සහකාර ඉඩම් කොමසාරිස් ඇතුළු ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් දරමින් කටයුතු කළේය. කැළණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ලබාගෙන ඇති ඔහු CIMA අවසාන විභාගය සමත්වී ඇති අතර, ඔහු ජාත්‍යන්තර සබඳතා සහ මහජන සම්පත් ලබාදීම පිළිබඳ ඩිප්ලෝමා පත්වීම් ලබාගෙන ඇත.

නියෝජ්‍ය පොලිස්පති ඉන්දික හපුගොඩ මහතා

ඉන්දික මහතා ලබා ඇති වෙනත් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් අතර ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යායතනයෙන් සැපයුම් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA) ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් අපරාධ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව ද වේ. 1998 දී උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණු ඉන්දික මහතා 2021 වර්ෂයේ දී නියෝජ්‍ය පොලිස්පති නිලයට පත් කිරීමෙන් අනතුරුව දැනට රථවාහන පරිපාලනය සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස සේවය කරයි ඔහු 2008-2010 කාලයේදී නැගෙනහිර ටිමෝරයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා රාජකාරි ඉටු කර ඇත. ඔහු ඉන්දියාව, චීනය, තායිලන්තය, වියට්නාමය, සිංගප්පූරුව සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල පැවති පුහුණු වැඩසටහන් රැසක ද නිරත වී ඇත.

වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා

වෛද්‍ය සුනිල් මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් වෛද්‍ය විද්‍යාව හා ශල්‍යවේදී උපාධිය ලබා ඇති අතර ඔහු විද්‍යාපති උපාධිය (ප්‍රජා වෛද්‍ය විද්‍යාව) සහ වෛද්‍ය විද්‍යාව (වෛද්‍ය පරිපාලනය) පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ද, වයඹ විශ්වවිද්‍යාලයෙන් පාරිසරික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ලබා ඇත. වෛද්‍ය සුනිල් මහතා වෛද්‍ය නිලධාරියකු ලෙස සේවය කර 1997 වසරේ දී වෛද්‍ය අධිකාරිවරයෙකු ලෙස උසස්වීම් ලබා වෛද්‍ය පරිපාලන සේවයට ඇතුළත් වී ඇත. අනතුරුව 2001 වසරේ වයඹ පළාතේ සෞඛ්‍ය සේවා පළාත් අධ්‍යක්ෂවරයකු ලෙස උසස්වීම් ලැබූ ඒ මහතා 2012 වසරේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් වූ වෛද්‍ය සුනිල් මහතා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) ලෙස ද කටයුතු කර ඇත.

අරුණ ප්‍රියදර්ශ කුරුම්බලපිටිය මහතා

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවාවේ වසර 30කට අධික සේවා පළපුරුද්දක් ඇති අරුණ ප්‍රියදර්ශ කුරුම්බලපිටිය මහතා යනු ප්‍රවීන මූල්‍ය කළමනාකරණ සහ කළමනාකරණ විගණන විශේෂඥයෙකු වෙයි. දැනට ඔහු කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරයි. කුරුම්බලපිටිය මහතා, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාපති උපාධියක් සහ මහජන පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇති අතර, CA Sri Lanka සහ APFA යන වෘත්තීය ආයතනවල සාමාජිකත්වයද දරයි. මූල්‍ය කළමනාකරණය, සැලසුම් කිරීම, අවදානම් ඇගයීම සහ රජයේ ප්‍රධාන ආයතනවල ගිණුම් සම්මත ක්‍රම රඳවාගැනීම ඔහුගේ විශේෂඥ කෂේත්‍රයන් වෙයි. මීට අමතරව, ඔහු ආයතන රැසක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කර, රාජ්‍ය මූල්‍ය පාලනය සඳහා විශාල දායකත්වයක් ලබා දී ඇත.

5. ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ වාර්තාව

SUWA SERIYA FOUNDATION

Established by Act of Parliament No. 18 of 2018

2024 වසර දෙස නැවත හැරී බැලීමේදී, 1990 සුව සැරිය පදනම ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතියේ ශක්තියේ හා සේවාවේ සංකේතයක් වශයෙන් තවමත් තම සේවාව නොසැලී ඉදිරියට ගෙනයමින් සිටී. මෙම වසරද නැවතත් මූල්‍යමය පීඩන, කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ අභියෝග සහ සේවාව සඳහා වැඩිවී ගිය ඉල්ලුම යන අවස්ථාවන් කෙරෙහි අපගේ දරා ගැනීමේ හැකියාවන් පරීක්ෂා කළ වසරක් විය. කෙසේ වෙතත් අපගේ කණ්ඩායමේ සියළු සාමාජිකයන්ගේ කැපවීමෙන්, සහයෝගීතාවය හේතුවෙන්, ලෝක බැංකුව විසින් අපගේ සේවාව ලෝකයේ තොරතුරු තාක්ෂණයෙන් ඉදිරියෙන් සිටින, වේගවත්ම හා නොමිලේ සේවාව ලබාදෙන ගිලන් රථ සේවාවක් ලෙස පිළිගෙන ඇත.

කැළණිය විශ්වවිද්‍යාලය සමඟ එක්ව ක්‍රියාත්මක හදිසි වෛද්‍ය තාක්ෂණික ශිල්පීන් (EMT) සඳහා වන පුහුණු වැඩසටහන සහ ගිලන් රථයක් භාරගන්න (Adopt an Ambulance) යන ව්‍යාපෘතීන් හරහා අපගේ සාර්ථකත්වය තවදුරටත් ඔප්නැංවෙන ලදී. එසේම, එක්සත් රාජධානියේ නව බකිංහැම්ෂයර් විශ්ව විද්‍යාලය සමඟ ඇතිකරගත් නව සම්බන්ධතාවය හරහා පර්යේෂණ සඳහා නව අවස්ථාවන්, වෛද්‍ය නවෝත්පාදනය සහ එක්සත් රාජධානියේ ප්‍රමුඛ ආපදා සත්කාර ආයතන සමඟ සහයෝගීතාවයන් සඳහා දොරටු විවෘත කරයි. මෙකී උත්සාහයන් හරහා දේශීය මෙන්ම විදේශීය සබඳතා ස්ථාවර කරමින් තිරසාර වූ පූර්ව රෝහල් සත්කාරක සේවාවක් ඉදිරියට දායාද කිරීමට අපගේ අධිෂ්ඨානය මනාව පිළිබිඹු කරයි.

මෙම සේවාවේ මූලික අඩිතාලම සහ ශක්තිය වන අපගේ කාර්ය මණ්ඩලය වෙත මාගේ හදපිරි ස්තූතිය සේවාව වෙනුවෙන් පුදකර සිටිමි. අළුතින් පත්වූ සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමජිකයන් වෙත ඔවුන්ගේ නව නායකත්වය සහ කැපවීම වෙනුවෙන් කෘතඥතාවය පුදකර සිටිමි. එසේම, අපගේ හිටපු සභාපති දුමින්ද රත්නායක මහතා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද, පදනම වර්තමාන තත්වයට ගෙන ඒම පිළිබඳව ඔවුන්ගේ දර්ශනය සහ මඟ පෙන්වීම පිළිබඳව ගෞරවපූර්වක ස්තූතිය පළ කරමි.

එකමුතුව, නවෝත්පාදන සහ අධිෂ්ඨානය සමඟින් ශ්‍රී ලංකාව පුරා හදිසි රෝහල් සත්කාරක සේවාව ප්‍රවර්ධනය කරමින් ජීවිත ආරක්ෂා කිරීමට එක්ව කටයුතු කරමු.

1990 සුව සැරිය පදනම

සොහාන් ද සිල්වා
ප්‍රධාන විධායක නිලධාරී

In case of Emergency: T: 1990 | +94 11 204 5801
Official Address (Head Office): 415, Kotte Road, Rajagiriya, Sri Lanka | T: +94 11 217 4829 | e: info@1990.lk

ප්‍රධාන විධායක නිලධාරියාගේ කෙටි විස්තරය

සොහාන් ද සිල්වා මහතා 1990 සුවසැරිය පදනමේ පළමු සහ වත්මන් ප්‍රධාන විධායක නිලධාරියා වේ. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 20 කට වැඩි පළපුරුද්දක් ඇති සොහාන් මහතා ඩිජිටල් පරිවර්තනය සහ තාක්ෂණය පදනම් කරගත් ක්‍රියාත්මක කිරීම, ක්‍රියාවලි කළමනාකරණය සහ මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ විශේෂඥයෙකි. 2018 වසරේදී ඔහු 1990 සුවසැරිය පදනමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ භූමිකාවට පිවිසියේය. ඔහු මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියක් සහ ඕස්ට්‍රේලියාවෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA) ලබා ඇත. හදිසි සහ ආපදා කළමනාකරණය සමග තාක්ෂණික දියුණුව ඒකාබද්ධ කිරීමේ ඔහුගේ ආශාව සහ ප්‍රවීණත්වය මත කැනඩාවේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ කීර්තිමත් ආයතනවලින් ආපදා කළමනාකරණය පිළිබඳ සුදුසුකම් කිහිපයක් ඔහුට ලබා දී ඇත. සොහාන් මහතා බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සහ හදිසි අවස්ථා කළමනාකරුවන්ගේ ජාත්‍යන්තර සංගමයේ ද සාමාජිකයෙකි. ඔහු හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳ කර්මාන්ත පදනම් කරගත් සහතික කිහිපයක් ද සපුරා ඇත.

6. ආයතනික පාලන වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලය

1990 සුවසැරිය පදනමේ පරිපාලන සහ කළමනාකරණ කටයුතු කැපවූ පුද්ගල කණ්ඩායමකින් සමන්විත අධ්‍යක්ෂක මණ්ඩලයකට පවරා ඇත. මණ්ඩලය සාමාජිකයින් හත් දෙනෙකුගෙන්, එනම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ පොලිස්පති නියෝජනය කරන නිලබලයෙන් පත්වන සාමාජිකයින් තිදෙනෙකු සහ වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය තාක්ෂණය, මූල්‍ය, කළමනාකරණය, පරිපාලනය, නීතිය යන ක්ෂේත්‍රවල අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ජනාධිපතිවරයා විසින් පත් කරන ලද තවත් සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම සාමාජිකයින් 2018 වසරේ පදනම ආරම්භයේ සිටම මෙම සේවාව රටේ හොඳම ජාතික සෞඛ්‍ය අංශයේ සේවාවන්ගෙන් එකක් බවට පත් කිරීම සඳහා මගපෙන්වීම්, උපදෙස් සහ සහාය ලබා දෙමින් ගෞරවනීය ධාරිතාවයකින් මණ්ඩලයට සේවය කරයි. සමාලෝචිත කාල සීමාව තුළ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් දහයක් පවත්වා ඇති අතර අධ්‍යක්ෂක මණ්ඩලය මාසිකව සහ අමතරව සූදානම් කරන ලද විශේෂ රැස්වීම් හිදී රැස්වේ.

විගණන කමිටුව

විගණන කමිටුව පිහිටුවා ඇත්තේ යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලවය. විගණන කමිටුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත් කරනු ලබන අතර පදනමේ අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා කමිටුවේ මුලසුන හොබවයි. විගණන කමිටුව ස්වාධීනව පදනමේ ක්‍රියාකාරකම් පරීක්ෂා කර ඇගයීමට ලක් කරයි. සමාලෝචිත කාල සීමාව තුළ විගණන කමිටු රැස්වීම් තුනක් පැවැත්විණි. විගණන කමිටු වාර්තාව 11-12 පිටුවල දක්වා ඇත.

අභ්‍යන්තර පාලනය

පදනමේ සියලුම කාර්යයන් නිසි ලෙස අවසර දී ඇති ආකාරයට සිදුවන ලෙසට අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යන බව සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුව ඇත. මානව සම්පත් සහ පරිපාලන, මූල්‍ය සහ සැපයුම් දාම කළමනාකරණ (SCM), හදිසි අණ සහ පාලන මධ්‍යස්ථාන (ECCC), මෙහෙයුම්, ප්‍රවාහන, පුහුණු සහ ප්‍රොටෝකෝල, සහ තත්ත්ව පාලන සඳහා නිශ්චිත ක්‍රියාකාරකම් සමගින් නිර්මාණය කර ඇති අංශ සමග ක්‍රියාකාරී සංවිධාන ව්‍යුහයක් ක්‍රියාත්මක වේ. එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඍජුවම පදනමේ ප්‍රධාන විධායක නිලධාරී වෙත වාර්තා කරයි.

7. විගණන කමිටු වාර්තාව

විගණන කමිටු වාර්තාව - 2024

විගණන කමිටුව අත්‍යවශ්‍යයෙන්ම මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් වැනි ක්ෂේත්‍රවල කළමනාකරණ මණ්ඩලයට සිය වගකීම් ඉටුකර ගැනීම සඳහා උපාය මාර්ගික කාර්යභාරයක් ඉටු කරන කමිටුවකි. විගණන කමිටුවේ මූලසුන දරන්නේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර තවත් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ද සාමාජිකයින් වේ. කමිටුවට ජ්‍යෙෂ්ඨ සහායක කාර්ය මණ්ඩලයේ සහාය ලැබෙන අතර, කමිටුවේ රාජකාරි ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය හා විගණන විශේෂඥතාවක් ඇත.

විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටු ප්‍රඥප්තිය

රාජ්‍ය ව්‍යාපාරයන්හි විගණන කමිටු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 01/2021 දරන චක්‍රලේඛය මගින් පාලනය වේ.

ප්‍රධාන අවධානය

විගණන කමිටුව මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සහ මෙහෙයුම් කාර්යයන් පිළිබඳ ස්වාධීන සහ වෛෂයික සමාලෝචනයක් ලබා දීමෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සිය රාජකාරි ඉටු කිරීමට සහාය වීම කෙරෙහිය.

කමිටු රැස්වීම්

2024.12.31 වර්ෂය අවසාන වන විට රැස්වීම් තුනක් (03) පවත්වා ඇත. කමිටු රැස්වීමේ සටහන් වාර්තා තබා ඇති අතර ඒවා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා කරන ලදී. විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ලෙස විගණන අධිකාරීවරයා අදාළ රැස්වීම් සඳහා සහභාගි වී ඇත. ආරාධනයෙන් රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක රැස්වීම් සඳහා සහභාගි වී ඇත.

2024 වසර තුළදී කමිටුවේ සංයුතිය වෙනස් වූ අතර, එම වසරේදී පැවති කමිටු රැස්වීම්වලට සාමාජිකයින්ගේ සහභාගීතාව පහත පරිදි වේ.

අධ්‍යක්ෂකවරයාගේ නම	කමිටුවේ දරන ධුරය	සහභාගි වූ රැස්වීම් ගණන
අරුණ කුරුම්බලපිටිය මහතා	සභාපති	2/2 (2024.11.25 දක්වා)
තරිඳු කාරියවසම් මහතා		0/0 (2024.11.26 සිට)
වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා	සභාපති / සාමාජික	2/2 (2024.08.26 දක්වා)
සන්ධ්‍යා සල්ගාදු මහත්මිය	සාමාජික	2/3 (2024.12.31 දක්වා)

2024 වර්ෂයේදී කමිටුව:

- 2023 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ විස්තරාත්මක විගණකාධිපති වාර්ථාව සමාලෝචනය කර ඇති අතර ඉදිරිපත් කර ඇති විගණන විමසුම් සඳහා ප්‍රතිචාර සමාලෝචනය කර එහි සඳහන් කර ඇති අඩුපාඩු, නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සලකා බලන ලදී.

1/2

- 2023 දෙසැම්බර් 31 වැනිදාට අවසන් වාර්ෂික මුදල් ප්‍රකාශන පිළිබඳ කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරනු ලැබූ අතර විගණන අධිකාරීවරයා සඳහන් කළේ, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මුදල් ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පෙර ඒවා විගණන සහ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම වඩාත් යෝග්‍ය ක්‍රමයක් වුවද, කාල සීමා සම්බන්ධයෙන් පවතින සීමාවන් හේතුවෙන් එය ප්‍රායෝගික නොවන බවය.

- මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු. මිලියන 330 ක මුදල පිළිබඳව සාකච්ඡා කෙරිණි. මෙම මුදල ලබා ගැනීම හෝ මුදල් ප්‍රකාශනයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත නැවත දන්වා ඔවුන්ගේ තීරණය ලබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදී.

- 2023 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තාව පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය. මෙහිදී ප්‍රධාන අභ්‍යන්තර විගණකාධිපතිනිය සඳහන් කළේ, පදනම විසින් ලබා දී ඇති සියලු ප්‍රතිචාර සමග එකග විය හැකි බවය.

- 1990 සුව සැරිය පදනමේ සේවකයින්ගේ වැටුප් වර්ධක සහ උසස්වීම් ගැටලු පිළිබඳව සාකච්ඡා කෙරිණි. සෞඛ්‍ය අමාත්‍යංශයේ අතිකාල ක්‍රමවේදය අභිබවා නොයන පරිදි පදනමේ සියලුම සේවකයින් සඳහා අනුගමනය කළ හැකි අතිකාල වැඩ මාර්ගෝපදේශයක් සකසා ඒ සඳහා අවසර ලබා ගැනීමට තීරණය කරන ලදී.

- 2025 වර්ෂය සඳහා සකස් කළ අයවැය ඇස්තමේන්තුව පිළිබඳව සාකච්ඡා කර, එය ක්‍රියාත්මක කිරීම සඳහා අවසර ලබා දින ලදී.

බාහිර විගණනය

2018 අංක 19 ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා ලෙස පත් කරන ලදී. විගණකාධිපති විසින් පත් කරන ලද විගණන අධිකාරී සහ ඔහුගේ කාර්ය මණ්ඩලය, පදනමේ බාහිර විගණන කටයුතු සම්බන්ධීකරණය කරයි.

නිගමනය

විගණන කමිටුවේ මතය වන්නේ විගණන කමිටුවේ නිර්ණේය විෂයන් සියලු ප්‍රමාණාත්මක අංගයන් ආවරණය කර ඇති බවයි.

විගණන කමිටුව වෙනුවෙන්,



2 / 2

8. මෙහෙයුම් කාර්යසාධනය

1990 සුව සැරිය, 2024 ජූලි 28 වන දින විශිෂ්ට පූර්ව රෝහල් හදිසි සත්කාර සේවාවක් ලබා දීමේ වසර 8ක් සම්පූර්ණ කළේය. 1990 සුව සැරිය පදනම ලොව පුරා පූර්ව රෝහල් හදිසි සත්කාර ගිලන්රථ සේවාවන් හා සමගාමීව විශිෂ්ට කාර්යක්ෂමතා ප්‍රමිතීන් පවත්වා ගනී.

මෙම කාර්යක්ෂමතාවයට තවත් සාක්ෂියක් ලෙස, 2024 දී ලෝක බැංකුව විසින් විශාල ජීවිත බේරා ගනිමින් පුරවැසියන්ට ඉහළම මට්ටමේ පූර්ව රෝහල් හදිසි ගිලන්රථ සේවාවක් ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ගාස්තු රහිත 1990 සුව සැරිය ගිලන්රථ සේවාවට ප්‍රශංසා කර ඇත.

ලෝක බැංකුවේ දකුණු ආසියානු කලාපයේ උප සභාපති මාටින් රයිසර්, බ්ලොග් සටහනක ගිලන්රථ සේවාව තවදුරටත් ප්‍රශංසා කරමින් සඳහන් කළේ, ප්‍රමාද වූ සත්කාර නිසා ඇතිවන සංකූලතා අඩු කිරීම සහ වාර්තාගත කාලයකින් ගිලන්වූවන් නැවත ශ්‍රම බලකායට ඇතුළත් වීමට හැකියාව ලබා දීම මගින් රටේ ආර්ථිකයට ධනාත්මක දායකත්වයක් ලබා දෙන බවයි.

මෙම සේවාවේ ප්‍රධාන සන්ධිස්ථානයක් වූයේ 2024 අගභාගයේදී හදිසි අවස්ථා මිලියන 2 ක් සඳහා සහභාගී වීම වන අතර, එමගින් ශ්‍රී ලංකාවේ ජනතාව හදිසි වෛද්‍ය අවස්ථාවකදී තම ජීවිතවල වගකීම 1990 සුව සැරියට භාර දී ඇති බව සනාථ වේ.

20

1,276,009

ලද හදිසි ඇමතුම්

386,884

සහභාගිවන ලද හදිසි අවස්ථා

13:08

ප්‍රතිචාර දැක්වීමේ සාමාන්‍යය කාලය

කි.මී.8,896,962

ආවරණය කරන ලද දුර



567 - හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන්
515 - ගිලන්රථ රියදුරන්

“දින 7 ම පැය 24 පුරා - ජීවිත බේරා ගනිමින් ”

2024.12.31 දිනට සේවක සංඛ්‍යාව

2024 වර්ෂය අවසාන වන විට දිනකට ඇමතුම් 5,000 කට අධික ප්‍රමාණයක් හසුරවනු ලබන අතර ආරම්භයේ සිට ලැබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව 9,069,729 ක් වේ. මෙම ඇමතුම්වලින් 98.9% ක් සඳහාම පළමු නාදයේදීම පිළිතුරු ලබා දී ඇත. තවද ආරම්භයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුල සිද්ධීන් 2,175,571ක් හසුරුවා ඇති අතර දිනකට රෝගීන් 1,050කට අධික ප්‍රමාණයක් ප්‍රවාහනය කෙරේ. මිනිත්තු 02 කට අඩු ගිලන් රථය පණගැන්වීමේ කාලයක් සමග රට පුරා මිනිත්තු 13 යි තත්පර 08 ක්වූ සාමාන්‍ය ප්‍රතිචාර කාලයක් පවත්වා ගන්නා අතර දිවයින පුරා ගිලන්රථ 322 ක් සමග ක්‍රියාත්මක වන සේවාව දෛනිකව සාමාන්‍යය කිලෝමීටර 27,000 ක් පමණ ආවරණය කරයි.

සෑම ගිලන් රථයක්ම හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් සහ ගිලන් රථ නියමුවරුන්ගෙන් සමන්විත වන අතර ඔවුන් වැඩ මුර පදනම මත සේවය කරන අතර එමගින් ගිලන් රථය වසරේ සෑම දිනකම පැය 24 පුරාම ලබා ගත හැකිය. විශාල ජනගහනයකට සේවාව සැපයීම සඳහා කාර්ය මණ්ඩලයට විශාල ප්‍රදේශයක් පුරා වගකීම විහිදුනද, ගිලන්රථ සේවාවේ සහ කාර්ය මණ්ඩලයේ නිපුණතාවය ජනතාවගේ හදිසි වෛද්‍ය අවශ්‍යතා සපුරාලීමට සමත් වී තිබේ. 2024 දෙසැම්බර් 31 වන දිනට සේවා නියුක්තිය හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් 567 ක් සහ ගිලන් රථ නියමුවන් 515 ක් වේ.

බඳවා ගැනීම් සහ පුහුණු කිරීම්

2023 දී බඳවා ගැනීමේ ක්‍රියාවලියෙන් පසු, අයදුම්කරුවන් නොපැමිණීම සහ අවශ්‍යතා සපුරා නොමැති වීම හේතුවෙන් හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් සහ ගිලන් රථ නියමුවරුන් සීමිත සංඛ්‍යාවක් බඳවා ගන්නා ලද අතර, පුරප්පාඩු නැවත ප්‍රචාරය කරන ලදී. කෙසේ වෙතත්, 2024 මැද භාගය වන විට මැතිවරණය හේතුවෙන් සියලුම බඳවා ගැනීම් අත්හිටුවූ අතර, මැතිවරණ හේතුවෙන් නව කාර්ය මණ්ඩල බඳවා ගැනීම් ද අත්හිටුවා තිබුණි. 2024 අවසානය වන විට හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් 66 ක් සහ ගිලන් රථ නියමුවරුන් 47 ක් මූලික පුහුණුව සම්පූර්ණ කර ඇති අතර, හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් අභ්‍යාසලාභීන් කැලණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සමග එක්ව පරිපූරක වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව හදාරති.

ආපදා ස්ථානයක මූලික සෞඛ්‍ය සේවා සපයන්නන් ලෙස, අර්බුදකාරී තත්වයක් තුළ කාලෝචිත හා සුදුසු සත්කාර සැපයීම සඳහා අවශ්‍ය උපකරණ, පුහුණු පුද්ගලයින්, ස්ථාපිත ප්‍රොටෝකෝල සහ සන්නිවේදන පද්ධති තිබීම ඇතුළුව වෛද්‍ය හදිසි අවස්ථා වලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සහ කළමනාකරණය කිරීම සඳහා ගිලන්රථ සේවා මගින් පූර්ව ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වේ, බොහෝ විට ආපදා සැලසුම් කිරීම සහ අනෙකුත් සෞඛ්‍ය සේවා සපයන්නන් සමග සම්බන්ධීකරණය කිරීම සිදුවේ. 1990 සුව සැරිය පදනමේ කාර්ය මණ්ඩලය විවිධ පාර්ශවකරුවන් සමග සහයෝගයෙන් ප්‍රායෝගික අභ්‍යාසවල ද නිරත වන අතර, එම පිළිවෙත් යාවත්කාලීනව පවතින බව සහතික කරගැනීමට සහ එවන් අවස්ථා සඳහා සූදානම් වීමටද කටයුතු කරයි. ඒ අනුව, 1990 සුව සැරිය පදනමේ කාර්ය මණ්ඩලය 2024 දී කොළඹ ගිනි නිවන සේවා දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමග එක්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවිධානය කරන ලද වාර්ෂික ගිනි නිවන අභ්‍යාසයට සහභාගී විය.

තවද, ප්‍රධාන වෛද්‍ය නිලධාරිගේ මග පෙන්වීම යටතේ ඕස්ට්‍රේලියාවේ සහ එක්සත් රාජධානියේ පරිපූරක වෛද්‍ය විශේෂඥයින් විසින් කාර්ය මණ්ඩලයට කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු ලබා දෙන ලදී.

හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් සහ ගිලන් රථ නියමුවරුන් සඳහා කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් 2024 ඔක්තෝබර් මාසයේදී ප්‍රධාන වෛද්‍ය නිලධාරී වෛද්‍ය ශ්‍රීලාල් ද සිල්වා සහ පුහුණු හා ප්‍රොටෝකෝල අංශයේ මෙහෙයවීමෙන් ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පැවැත්විණි.



මූලික EMT කුසලතා සහ පුහුණු පාඨමාලාව (BEST) සහ පුහුණුකරු පුහුණු කරන්න (Train the Trainer) වැඩසටහන 2024 මාර්තු මාසයේදී පවත්වන ලද අතර, එය සිඩ්නි ලිවර්පූල් රෝහලේ හදිසි ප්‍රතිකාර පිළිබඳ විශේෂඥ වෛද්‍ය සහ නිව් සවුත් වේල්ස් ගිලන් රථ සේවයේ ගලවා ගැනීම පිළිබඳ රාජ්‍ය උපදේශක වශයෙන් කටයුතු කරන වෛද්‍ය සාංජ් ප්‍රනාන්දු මහතා සහ ඕස්ට්‍රේලියාවේ පරිපූරක වෛද්‍ය කණ්ඩායමක් විසින් මෙහෙයවන ලද අතර, ඕස්ට්‍රේලියාවේ මහ කොමසාරිස් අතිගරු පෝල් ස්ටීවන්ස් මහතා විසින් නිරීක්ෂණය කරන ලදී.

2024 ජුනි මාසයේදී, එක්සත් රාජධානියේ බකිංහැම්ෂයර් නව විශ්වවිද්‍යාලයේ මහාචාර්ය විල් බ්‍රෝටන් සහ පරිපූරක වෛද්‍ය විශේෂඥයින් කණ්ඩායමක් විසින් මෙහෙයවන ලද, හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා නිර්මාණය කරන ලද මූලික ජීවිත ආධාරක පුහුණු වැඩසටහනක් සාර්ථකව සම්පූර්ණ කළහ. මෙම කණ්ඩායම පදනමට පුහුණු උපකරණ පරිත්‍යාගයක් ද සිදු කළහ.

මීට අමතරව, සියලුම ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා නායකත්ව පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර, එහිදී නායකත්ව කුසලතා ප්‍රායෝගිකව වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලද අතර එමගින් ඔවුන්ගේ නිපුණතා තනි තනිව සහ කණ්ඩායමක් ලෙස වැඩි දියුණු කරන ලදී.

තවද, 1990 සුව සැරිය ගිලන්රථ ලබා ගැනීම සහ රෝහල්වල ස්ථාපනය කිරීමට නියමිත පැමිණීමේ ඇස්තමේන්තුගත වේලාව පිළිබඳ තිර පිළිබඳව රෝහල්වල හදිසි සේවා කාර්ය මණ්ඩලය සඳහා ආසියානු සංවර්ධන බැංකුව - සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ADB-HSEP) සහ ශ්‍රී ලංකා හදිසි ප්‍රතිකාර පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය සමග එක්ව දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

පරිත්‍යාග - ගිලන් රථයක් භාරගන්න

අයවැය හිඟය පියවා ගනිමින් අපගේ ජීවිත බේරා ගැනීමේ මෙහෙයුම් දිගටම කරගෙන යාම සඳහා ආරම්භ කරන ලද "ගිලන් රථයක් භාරගන්න" ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවේ ආයතනික ප්‍රජාවගේ ධනාත්මක ප්‍රතිචාර සමගින් ක්‍රියාත්මක වෙමින් පවතී.

සේවා පිළිගැනීම

2024 අප්‍රේල් 02 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාව කල් තබන අවස්ථාවේ සුව සැරිය ගිලන් රථ සේවාව සඳහා සහාය සහ පහසුකම් මැයෙන් ගරු රෝහිනී කුමාරි විජේරත්න මහත්මිය යෝජනාවක් ඉදිරිපත් කර 1990 සුවසැරිය පදනමේ සේවාවන්හි කාර්යක්ෂමතාවය පැසසුමට ලක් කෙරිනි.

9. මූල්‍යමය ක්‍රියාකාරීත්වය

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන්

1990 සුව සැරිය පදනම

2024 දෙසැම්බර් මස 31 දිනෙන්

අවසන් වූ වර්ෂය

සඳහා

මූල්‍ය ප්‍රකාශන

1990 සුව සැරිය පදනම   **පිටුව 1**

දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	2024.12.31 රු.	2023.12.31 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	4	985,161,489	812,666,168
මුළු ජංගම නොවන වත්කම්		985,161,489	812,666,168
ජංගම වත්කම්			
තොගය	5	142,478,868	137,795,724
අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	6	441,074,908	421,370,688
මුදල් සහ මුදල් හා සමාන දෑ	7	1,099,471,153	1,009,958,277
මුළු ජංගම වත්කම්		1,683,024,930	1,569,124,689
මුළු වත්කම්		2,668,186,419	2,381,790,857
අරමුදල් සහ වගකීම්			
සමුච්චිත අරමුදල			
නම් කරන ලද සංචිත - ප්‍රාග්ධනය - ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන	8	55,433,217	176,627,794
සීමා කරන ලද අරමුදල් - ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන	9	667,751,138	667,751,138
නම් කරන ලද සංචිත -ප්‍රාග්ධනය- ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රදාන	10	502,524,685	453,880,115
ප්‍රත්‍යාගණන සංචිතය	11	551,405,000	247,925,000
නම් කරන ලද සංචිත - පරිත්‍යාගශීලීන්ගෙන් ප්‍රාග්ධන ප්‍රදානය	12	36,370,525	29,085,500
සමුච්චිත අතිරික්තය / (හිඟය)		566,382,797	511,631,438
සීමා කරන ලද අරමුදල් - පරිත්‍යාගශීලීන්ගෙන් ලද ප්‍රදාන		22,500,000	-
මුළු සමුච්චිත අරමුදල		2,402,367,362	2,086,900,985
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	13	144,811,806	128,622,431
මුළු ජංගම නොවන වගකීම්		144,811,806	128,622,431
ජංගම වගකීම්			
වෙනත් ගෙවීම්	14	40,587,860	63,460,556
සීමා කරන ලද අරමුදල් - නව ගිලන් රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	15	80,419,391	102,806,885
මුළු ජංගම වගකීම්		121,007,251	166,267,441
මුළු වගකීම්		265,819,057	294,889,872
මුළු සමුච්චිත අරමුදල සහ වගකීම්		2,668,186,419	2,381,790,857

පිටු 5 සිට 16 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ ලාභ නොලබන සංවිධාන සඳහා නිර්දේශිත භාවිතය පිළිබඳ ප්‍රකාශනයට අනුකූලව සකස් කර ඇති බව සහතික කරමි.

....

මූල්‍ය ප්‍රධානී   **ප්‍රධාන විධායක නිලධාරි**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කර ඇත;

....

සභාපති / අධ්‍යක්ෂ   **අධ්‍යක්ෂ**

2025 අප්‍රේල් 11
කොළඹ.

විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශය

	සටහන	2024.12.31න් අවසන් වසර සඳහා රු.	2023.12.31න් අවසන් වසර සඳහා රු.
මෙහෙයුම් ආදායම			
ලැබූ අදායම්	16	2,424,828,539	2,223,444,915
මුළු මෙහෙයුම් ආදායම		2,424,828,539	2,223,444,915
මෙහෙයුම් වියදම්			
සෘජු වියදම්	17	(2,190,143,321)	(1,901,246,655)
වක්‍ර වියදම්	18	(388,218,153)	(320,738,766)
මුළු මෙහෙයුම් වියදම්		(2,578,361,475)	(2,221,985,421)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ අතිරික්තය / (හිඟය)		(153,532,935)	1,459,494
වෙනත් ආදායම්			
වෙනත් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම	19	202,622,090	263,863,037
මූල්‍ය ආදායම	20	4,189,580	4,607,563
මුළු අනෙකුත් ආදායම්		206,811,671	268,470,600
වසර සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)		53,278,735	269,930,094
වෙනත් විස්තීරණ අදායම්			
ප්‍රත්‍යාගණන සංචිතය	4.2	303,480,000	-
මුළු විස්තීරණ අදායම්		356,758,735	269,930,094

පිටු 5 සිට 16 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

1990 සුව සැරිය පදනම

සමුච්චිත අරමුදලේ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

සටහන 3

	නම් කරන ලද සංචිත - ප්‍රාග්ධන -ඉන්දියා රජයෙන් ලද ප්‍රදාන	සීමා කරන ලද අරමුදල් -ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන	නම් කරන ලද සංචිත - ප්‍රාග්ධනය - ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන ප්‍රදාන	නම් කරන ලද සංචිත - පරිත්‍යාගශීලීන්ගෙන් ප්‍රාග්ධන ප්‍රදානය	ප්‍රත්‍යාගණන සංචිත	සමුච්චිත අතිරික්තය /(හිඟය)	සීමා කරන ලද අරමුදල් - පරිත්‍යාගශීලීන්ගෙන් ලද ප්‍රදාන	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.		රු.
2023 ජනවාරි 01 දිනට ශේෂය	**366,170,755**	**679,434,218**	**418,940,000**	-	**247,925,000**	**241,701,344**	-	**1,954,171,317**
වර්ෂය තුළ භාවිතා කරන ලද අරමුදල්	-	(11,683,080)	-	29,085,500	-	-		17,402,420
වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධිවූ සංචිත	-	-	-		-	-		-
වසර තුළ දේපළ, පිරියත සහ උපකරණ එකතු කිරීම් මාරු කිරීම	-	-	418,940,000		-	-		418,940,000
වර්ෂය තුළ වෙනත් මාරුකිරීම්	-	-	-		-	-		-
ක්ෂයවීම් හේතුවෙන් උපලබ්ධිවූ අරමුදල්	(189,542,961)	-			-	-		(189,542,961)
මෝටර් රථවල අතිරික්තය නැවත තක්සේරු කිරීම	-	-	-		-	-		-
ප්‍රත්‍යාගණනය මත උපලබ්ධි නොවූ සංචිත	-	-	-		-	-		-
වසර සඳහා අතිරික්තය / හිඟය	-	-	-		-	269,930,094		269,930,094
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**176,627,794**	**667,751,138**	**837,880,000**	**29,085,500**	**247,925,000**	**511,631,438**	-	**2,470,900,870**
පෙර වර්ෂයන්ට අදාල ගැලපුම්	-	-	**(2,750,436)**	**(13,813)**	-	**1,483,023**	-	**(1,281,225)**
2024 ජනවාරි 01 දිනට ශේෂය	**176,627,794**	**667,751,138**	**835,129,564**	**29,071,687**	**247,925,000**	**513,114,462**	-	**2,469,619,645**
වර්ෂය තුළ භාවිතා කරන ලද අරමුදල්	-	-	-	10,554,208	-	-		10,554,208
වර්ෂය තුළ ලැබිය යුතු අරමුදල්							22,500,000	22,500,000
වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධිවූ සංචිත	-	-	-		-	-		-
වසර තුළ දේපළ, පිරියත සහ උපකරණ එකතු කිරීම් මාරු කිරීම	-	-	144,387,494		-	-		144,387,494
ක්ෂයවීම් හේතුවෙන් උපලබ්ධිවූ අරමුදල්	(121,194,577)	-	(34,063,000)		-	-		(155,257,577)
මෝටර් රථවල ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	-		303,480,000	-		303,480,000
ප්‍රත්‍යාගණනය මත උපලබ්ධි නොවූ සංචිත		-	-		-	-		-
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)	-	-	-		-	53,278,735		53,278,735
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**55,433,217**	**667,751,138**	**945,454,058**	**39,625,895**	**551,405,000**	**566,382,797**	**22,500,000**	**2,848,552,105**

සටහන - පෙර වර්ෂයන්ට අදාල ගැලපුම්

වෛද්‍ය උපකරණ සහ කාර්යාල උපකරණ සඳහා ක්ෂයවීම් ගණනය කිරීම් වලදී සමහර තාක්ෂණික දෝෂ හඳුනාගෙන ඇති අතර, වත්මන් කාලපරිච්ඡේදය තුළ මෙම දෝෂ නිවැරදි කිරීම සඳහා පෙර වසරේ ගැලපීම් සිදු කර ඇත.එමගින් ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු නම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන සංචිත සඳහා රු.2,750,436 කින් සහ පරිත්‍යාගශීලීන්ගෙන් ලැබුණු නම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන සංචිත සඳහා රු.13,813 කින් සහ රඳවා ගත් ඉපැයීම් සඳහා රු.977,773 කින් බලපෑමක් ඇතිවිය.

පිටු 5 සිට 16 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

1990 සුව සැරිය පදනම

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2024.12.31න් අවසන් වසර සඳහා රු.	2023.12.31න් අවසන් වසර සඳහා රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
ශුද්ධ අතිරික්තය / (හිඟය)		53,278,735	269,930,094
අතිරික්ත / (හිඟය) ශුද්ධ මුදල් ප්‍රවාහයට සැසඳීම සඳහා ගැලපීම්:			
මුදල් නොවන අයිතම:			
ක්ෂය වීම	4	277,188,642	45,239,334
විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	13	22,044,500	22,671,250
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය		352,511,877	337,840,678
ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂික	13	(5,855,125)	(5,948,444)
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය		346,656,752	331,892,234
කාරක ප්‍රාග්ධන ගැලපීම්:			
(වැඩි වීම) / අඩු වීම:			
තොගය	5	(4,683,144)	(82,848,232)
අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	6	(19,704,221)	(57,899,824)
වෙනත් ගෙවිය යුතු	14	(22,872,696)	(42,491,691)
සීමා කරන ලද අරමුදල් - නව ගිලන් රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ප්‍රාග්ධන ප්‍රදාන	15	(22,387,494)	47,000,000
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		277,009,197	195,652,487
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහය			
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	4	(147,990,438)	(48,800,091)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		(147,990,438)	(48,800,091)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහය			
අරමුදල් ගිණුම් වැඩි වීම / (අඩු වීම).		(39,505,883)	17,402,420
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		(39,505,883)	17,402,420
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම / (අඩු වීම)		89,512,876	164,254,816
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ		1,009,958,277	845,703,462
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	7	1,099,471,154	1,009,958,278

පිටු 5 සිට 16 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. සාමාන්‍ය තොරතුරු

1990 සුව සැරිය පදනම 2018 අංක 18 දරන පාර්ලිමේන්තු පනත යටතේ, එකී බලතල ප්‍රකාරව 2018 ජූලි 04 දින ස්ථාපිත කර ඇත.

1990 සුව සැරිය පදනම මගින්, සේවකයින් 1307 දෙනෙකුගේ දායකත්වයෙන් සමන්විත දිවයින පුරා නොමිලේ පූර්ව රෝහල් හදිසි ප්‍රතිකාර ගිලන්රථ සේවාවක් සපයයි. පදනමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 415, කෝට්ටේ පාර, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇති අතර දිවයින පුරා මධ්‍යස්ථාන 322 ක් ඇත.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ලාභ නොලබන සංවිධාන සඳහා නිර්දේශිත පරිචයන් පිළිබඳ ප්‍රකාශයට (SL SoRP – NPOs) අනුකූලව සකස් කර ඇත.

2.2 මිනුම් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශනයන්හි සාධාරණ අගයෙන් දක්වා ඇති ඇති මූල්‍ය සුරැකුම් සහ මූල්‍ය මෙවලම් සම්බන්ධයෙන් හැර, ඓතිහාසික පිරිවැය සම්මුතිය භාවිතා කරමින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ පදනමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් (රු.) ය.

2.4 ඇස්තමේන්තු සහ තීන්දු උපයෝගී කර ගැනීම

ශ්‍රී ලංකා ලාභ නොලබන සංවිධාන සඳහා නිර්දේශිත පරිචයන් පිළිබඳ ප්‍රකාශයට (SL SoRP – NPOs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකාරීත්වයට ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගැනීමට සහ වාර්තා වූ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු සහ විනිශ්චයන්ගෙන් වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ බලපවත්වන උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු සංශෝධනය කරන කාල සීමාව තුළ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සංශෝධන ද හඳුනා ගනියි. සංශෝධන අනාගත කාලපරිච්ඡේදවලට බලපාන්නේ නම් එවැනි සංශෝධන අනාගත කාල පරිච්ඡේදවලදී ද හඳුනා ගනියි.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ඇති ප්‍රමාණ කෙරෙහි ඉතා වැදගත් බලපෑමක් සිදු කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ දී ඇස්තමේන්තු කිරීම්, අවිනිශ්චිතතාව සහ තීරණාත්මක විනිශ්චයන් සම්බන්ධ වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු පහත සටහන් තුළ ඇතුළත් කර ඇත.

- සටහන 4 – දේපළ, පිරියත සහ උපකරණ
- සටහන 12 – සේවක ප්‍රතිලාභ

2.5 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් සහ හෙළිදරව් කිරීම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් අඛණ්ඩව යෙදී ඇති අතර පෙර වසරවල භාවිතා කළ ඒවාට අනුකූල වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

3.1 විදේශ මුදල් පරිවර්තනය

විදේශ මුදල් ගනුදෙනු සංවිධානයේ ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරනු ලබන්නේ ගණුදෙණු කරන දිනවලදී පවතින විනිමය අනුපාත (spot exchange rate) භාවිතා කරමිනි. එවැනි ගණුදෙනු පියවීම නිසා සහ වසර අවසාන විනිමය අනුපාත යටතේ මුදල් අයිතම නැවත මැනීමෙන් ඇතිවන විදේශ විනිමය ලාභ සහ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

ඓතිහාසික පිරිවැයෙන් මනිනු ලබන මුදල් නොවන අයිතම නැවත පරිවර්තනය නොකෙරේ. සාධාරණ අගය මත මනිනු ලබන මුදල් නොවන අයිතම සාධාරණ අගය තීරණය කළ දිනයේ පවතින විනිමය අනුපාතවලට පරිවර්තනය කරයි.

3.2 මුදල් හා මුදල් සමාන දෑ

කලින් දන්නා මුදල් ප්‍රමාණවලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ අගය වෙනස් වීමේ අවදානමකට නොගැනිය හැකි ඉහළ ද්‍රවශීලතාවක් සහිත කෙටිකාලීන ආයෝජනවලින් හා අත ඇති මුදල්වලින් සහ ඉල්ලුම් තැන්පතුවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, ශුද්ධ බැංකු අයිරාවලින් ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කර සකස් කර ඇත.

3.3 මූල්‍ය උපකරණ (Financial Instruments)

මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් පහත සඳහන් කාණ්ඩවලට වර්ග කර ඇත; ලාභය සහ අලාභය හරහා සාධාරණ අගයක් සහිත මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් තබා ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු මුදල්, සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම්.

ලාභ හා අලාභ හරහා සාධාරණ අගයකින් යුත් මූල්‍ය වත්කම්

ලාභය සහ අලාභය හරහා සාධාරණ අගයකින් යුත් මූල්‍ය වත්කම් ජංගම වත්කම් ලෙස වර්ග කර ඇති අතර, ඕනෑම ප්‍රතිඵලයක් සහ ලාභ හෝ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

ලැයිස්තුගත සුරැකුම්වල සාධාරණ අගය වනුයේ වාර්තා කරන දිනයේ දී ඒවායේ ලංසු තැබූ මිල වේ. මූල්‍ය ආදායම ප්‍රධාන වශයෙන් පොලී සහ සාධාරණ අගයේ වෙනස්වීම් මත සාක්ෂාත් කර ගත් සහ සාක්ෂාත් කර නොගත් ශුද්ධ ලාභ වලින් සමන්විත වේ. වත්කමේ ඵලදායි ප්‍රතිලාභය සැලකිල්ලට ගනිමින් පොලී ආදායම උපචිත පදනම මත හඳුනා ගැනේ.

ණය සහ ලැබිය යුතු දෑ

පළමුව, ණය සහ ලැබිය යුතු දෑ ඒවා ආරම්භ වූ දිනයේ දී හඳුනා ගනු ලබයි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් මුලින්ම හඳුනා ගනු ලබන්නේ වෙළඳ දිනයේදීය. එනම් පදනම ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශවකරුවෙකු වන දිනය වේ. නොගෙවීමේ අවදානම ආවරණය කිරීම පිණිස ණය සහ ලැබිය යුතු දෑ හිඟ මුදල් මත දීමනාවක් අඩු කර ශුද්ධ පිරිවැයට දක්වා ඇත.

මූල්‍ය වගකීම්

පදනමේ මූල්‍ය වගකීම්වලට සම්බන්ධ පාර්ශ්වයන්ට, ගෙවිය යුතු සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුළත් වේ. මූල්‍ය වගකීම් මුලින් හඳුනාගනු ලබන්නේ ගනුදෙනු කළ මිලටය. මූලික සටහන් කිරීමෙන් පසුව, ඒවා මනිනු ලබන්නේ ක්‍රමක්ෂය කළ පිරිවැයෙනි. මෙම මූල්‍ය වර්ෂය තුළ ගෙවිය යුතු කිසිදු සම්බන්ධ පාර්ශවයක් හඳුනා නොගත්තෙමු.

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය (සම්බන්ධිතයි)

3.3 මූල්‍ය උපකරණ (Financial Instruments) (සම්බන්ධිතයි)

මූල්‍ය වත්කම් අපහායනය

අපහායනයක් පිළිබඳ කිසියම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා එක් එක් වාර්තා කරන දිනයේදී මූල්‍ය වත්කමේ ධාරණ වටිනාකම සමාලෝචනය කෙරේ. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනය වී ඇති බවට කිසියම් වෛෂයික සාක්ෂි තිබේද යන්න පදනම විසින් තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනය වූ ලෙස සලකනු ලබන්නේ වත්කම හෝ වත්කම් ලෙසින් හඳුනා ගැනීමෙන් අනතුරුව (දරන ලද "අලාභ සිදුවීමක්") සිදුවීම් එකක් හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස සිදුවන හානිය පිළිබඳ වෛෂයික සාක්ෂි තිබේ නම් පමණක් සහ එම පාඩු සිදුවීම මූල්‍ය වත්කම්වල හෝ මූල්‍ය වත්කම් සමූහයක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට බලපෑමක් ඇති කරන විට සහ එම බලපෑම පහසුවෙන් තක්සේරු කළ හැකි විට ය.

3.4 තොගය

යල්පැන ගිය සහ අඩුවෙන් භාවිත වන වන අයිතම සඳහා නිසි දීමනාවක් ලබා දීමෙන් පසු බඩු තොග සත්‍ය පිරිවැය පදනම මත අගය කරනු ලැබේ.

3.5 දේපළ, පිරියත සහ උපකරණ

3.5.1 විධිමත්ව සටහන් කිරීම හා මිනුම් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම මගින් මනිනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ.
දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමවල කොටස් සඳහා එකිනෙක වෙනස් ඵලදායි අයු කාලයන් ඇති විට, එවැනි කොටස් දේපළ, පිරියත හා උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණන් ගනු ලැබේ.
දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ ලාභ හෝ අලාභ තීරණය කරනු ලබන්නේ බැහැර කිරීමෙන් ලැබෙන ආදායම දේපළ, පිරියත සහ උපකරණ වල ඉදිරියට ගෙනයන වටිනාකම සමඟ සංසන්දනය කිරීමෙන් වන අතර එම ලාභ හෝ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

3.5.2 පසුව සිදුවන පිරිවැය

පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය දේපළ හා උපකරණ අයිතමයේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අනෙකුත් සියලුම වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දරන ලද වියදම් ලෙස හඳුනාගෙන ඇත.

3.5.3 නැවත තක්සේරු කිරීම

සාධාරණ අගය විශ්වසනීයව මැනිය හැකි දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් නැවත තක්සේරු කිරීමේ දිනයේදී එහි සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීමෙන් නැවත තක්සේරු කළ අගයකට ගෙන යා යුතුය. යම් දේපළ, පිරියත සහ උපකරණයක් පසුව නැවත ඇගයීමට ලක් කළ විට, එවැනි වත්කමක මුළු පන්තියම නැවත ඇගයීමට ලක් කෙරේ.

සාධාරණ අගය සහ ධාරණ වටිනාකම අතර සැලකිය යුතු වෙනසක් ඇති විට, සාධාරණ අගය එහි ධාරණ වටිනාකමට වඩා සැලකිය යුතු වශයෙන් වෙනස් නොවන බව සහතික කිරීම සඳහා, වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු විසින් මෝටර් රථ සඳහා නැවත ඇගයීම සිදු කරනු ලැබේ.

නැවත තක්සේරු කිරීම හේතුවෙන් ධාරණ වටිනාකමේ වැඩි වීමක් නැවත තක්සේරු කිරීමේ අතිරික්තය යන ශීර්ෂය යටතේ සමුච්චිත අරමුදලට බැර කෙරේ. කෙසේ වෙතත්, එය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කලින් සටහන් කර ඇති එම වත්කමේ නැවත තක්සේරු කිරීමේ හිඟයක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට හැර වැඩි වීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ විධිමත්ව සටහන් කර ඇත. නැවත තක්සේරු කිරීමේ හිඟය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කලින් හඳුනාගෙන ඇති එම වත්කමේ නැවත තක්සේරු කිරීමේ අතිරික්තය පියවන ප්‍රමාණයට හැර වැඩි වීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කර ඇත. අපහරණයෙන් පසු, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාළ ඕනෑම නැවත තක්සේරු කරන ලද අතිරික්තයක් විස්තීරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ.

1990 සුව සැරිය පදනම — පිටුව **8**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය (සම්බන්ධිතයි)

3.5 දේපළ, පිරියත සහ උපකරණ (පෙර පිටුවෙන්)

3.5.4 ක්ෂය කිරීම්

අදාළ වත්කම්වල අපේක්ෂිත ඵලදායි ආයු කාලයට අනුව සරල රේඛීය පදනමක් මත සියලු වත්කම් සඳහා ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතයට ගන්නා විටදී වන අතර වත්කම් ක්ෂය වීම නතර වන්නේ එම වත්කම විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති දිනය සහ වත්කම භාවිතයට නොගත් දිනය දිනයන් වලින් පෙර දිනයේදී ය. ක්ෂයවීම් මාසික පදනමින් ගණනය කරනු ලබන අතර මිලදී ගත් මාසය සඳහා සම්පූර්ණයෙන් අය කෙරේ. වත්කම්වල ඵලදායී ආයු කාලයන් පහත පරිදි වේ:

වත්කම් වර්ගය	වසර ගණන
මෝටර් රථ- 1 අදියර (2022 සැප්තැම්බර් 30 දක්වා)	වසර 6
මෝටර් රථ- අදියර 2 සහ 3	වසර 6
තොරතුරු තාක්ෂණ උපකරණ	වසර 4
ගෘහ භාණ්ඩ සහ උපකරණ	වසර 8
වෛද්‍ය උපකරණ	වසර 8
මෘදුකාංග	වසර 5
මෙවලම්	වසර 5
කාර්යාලීය උපකරණ	වසර 5

අදියර 1 මෝටර් රථ 2022 ඔක්තෝම්බර් 31 වන දිනට නැවත තක්සේරු කර ඇති අතර එම මෝටර් රථවල අපේක්ෂිත ඵලදායි ආයු කාලය පහත පරිදි නැවත හඳුනා ගෙන ඇත.

වත්කම් වර්ගය	වසර ගණන
මෝටර් වාහන 15ක්	වසර 5
මෝටර් වාහන 61ක්	වසර 6
මෝටර් වාහන 05ක්	වසර 7
මෝටර් වාහන 04ක්	වසර 8

අදියර 2 මෝටර් රථ 2024 ඔක්තෝම්බර් 31 වන දිනට නැවත තක්සේරු කර ඇති අතර එම මෝටර් රථවල අපේක්ෂිත ඵලදායි ආයු කාලය පහත පරිදි නැවත හඳුනා ගෙන ඇත.

වත්කම් වර්ගය	වසර ගණන
මෝටර් වාහන 77ක්	වසර 2
මෝටර් වාහන 88ක්	වසර 3
මෝටර් වාහන 42ක්	වසර 4

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය (සම්බන්ධිතයි)

3.5 දේපළ, පිරියත සහ උපකරණ (පෙර පිටුවෙන්)

3.5.5 පරිත්‍යාග කළ වත්කම්

සීමිත අරමුදල් හරහා ව්‍යාපෘතියක කොටසක් ලෙස දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගන්නා විට, ව්‍යාපෘතිය අවසන් වූ පසු, වත්කම ප්‍රතිලාභියාට භාර නොදෙන්නේ නම් හෝ මුල් පරිත්‍යාගශීලියාට ආපසු ලබා නොදෙන්නේ නම්, ව්‍යාපෘතිය අවසන් වූ පසු වත්කම තක්සේරු කරන අතර ප්‍රාග්ධන සංචිතයක් හරහා දේපළ, පිරියත සහ උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන එන ලදී. එවැනි වත්කම්වල ක්ෂයවීම් සංචිතයට එදිරිව සිදු කෙරේ. ක්ෂය කිරීමේ අරමුණ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම පිණිස තක්සේරු දිනය මිලදී ගත් දිනය ලෙස සැලකේ.

3.5.6 වත්කම් අපහායනය

එක් එක් වාර්තා කිරීමේ දිනයකදී, වත්කම්වලට අලාභ හානි සිදුවී ඇති බවට කිසියම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ සමාලෝචනය කෙරේ. වත්කමක ධාරණ වටිනාකම එහි අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන සෑම අවස්ථාවකම අපහායන අලාභයක් හඳුනා ගැනේ. විස්තීරණ ආදායම් ප්‍රකාශයේ අපහායන අලාභ හඳුනාගෙන ඇත. අයකරගත හැකි මුදල තීරණය කිරීම සඳහා භාවිතා කරන ඇස්තමේන්තුවල වෙනසක් සිදුවී ඇත්නම්, අපහායන අලාභයක් ආපසු හරවන නමුත් කිසිදු අපහායන අලාභයක් හඳුනාගෙන නොමැති විට වත්කමේ ධාරණ අගය වනුයේ ක්ෂයවීම් හෝ ක්ෂයවීම්වල ශුද්ධ ප්‍රමාණය අනුව තීරණය කළ හැකි ධාරණ අගය ඉක්මවා නොයන තරමට පමණි.

3.6 සේවක ප්‍රතිලාභ

3.6.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් හැර වෙනත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් සමාගමේ ශුද්ධ බැඳීම එක් එක් සැලැස්ම සඳහා වෙන් වෙන් වශයෙන් ගණනය කරනු ලබන්නේ වත්මන් සහ පෙර කාල පරිච්ඡේදවලදී සේවකයින් ඔවුන්ගේ සේවය වෙනුවෙන් උපයා ඇති අනාගත ප්‍රතිලාභ ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමෙනි.

පදනම මගින් ගණනය කිරීම වාර්ෂික පදනමින් සිදු කරනු ලැබේ. සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුකූලව සියලුම සේවකයන් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂිත දීමනා සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනතට අනුව සේවකයකුට ගෙවීමේ වගකීම පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසුවය.

වගකීම බාහිර අරමුදල් මගින් මූල්‍යයනය කරනු නොලැබේ.

3.6.2 නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනයක් වෙනම ආයතනයකට ස්ථාවර දායකත්වයක් ගෙවන අතර අමතර මුදල් ගෙවීමට නීතිමය හෝ සාධනීය බැඳීමක් නොමැත. සියලුම සේවකයින් ආවරණය වන පරිදි සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය සඳහා වන බැඳීම් වියදම් දැරූ පරිදි ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනා ගනු ලැබේ.

පදනම අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල් දායකත්වය ලෙස සේවකයාගේ දළ වැටුපෙන් අනුපිළිවෙලින් 12% සහ 3% ලෙස දායක වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය (සම්බන්ධිතයි)

3.7 ලැබීම් සහ අරමුදල්/සංචිත භාවිතය සඳහා ගිණුම්කරණය

සංචිත

සංචිත සීමා කරන ලද හෝ නම් කරන ලද සංචිත ලෙස වර්ග කර ඇත.

අ) නම් කරන ලද සංචිත / අරමුදල්

නිශ්චිත කාර්යයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරන ලද සීමා නොකළ අරමුදල් නම් කරන ලද අරමුදල් ලෙස හඳුනා ගැනේ. මෙම අරමුදල් භාවිතා කළ හැකි ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

ප්‍රාග්ධන ස්වභාවයේ හඳුනාගත් ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක භාවිතය සඳහා වත්කම්/අරමුදල් ලැබෙන්නේ නම්, එවැනි වත්කම් සහ එම අරමුදල්වලින් මිලදී ගන්නා වත්කම් නම් කරන ලද සංචිත-ප්‍රාග්ධන ගිණුමට මාරු කරනු ලැබේ.

ආ) සීමා කරන ලද සංචිත / අරමුදල්

හඳුනාගත් ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක භාවිතය සඳහා ප්‍රදාන ලැබෙන විට, එම අරමුදල් සීමා කරන ලද අරමුදල් ගිණුමක තබාගෙන එම හඳුනාගත් ව්‍යාපෘතියට අදාළව දරන ලද වියදම් සමඟ ගැලපීම සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ. භාවිතයට නොගත් අරමුදල් ඔවුන්ගේ අදාළ අරමුදල් ගිණුම්වල තබා ඇති අතර ඒවා අවශ්‍ය වන තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සමුච්චිත අරමුදලට ඇතුළත් කර ඇත.

මෙම සීමා කරන ලද අරමුදල් භාවිතා කළ හැකි සහ භාවිතා කරන ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් වල හඳුනාගෙන ඇත.

ඇ) ප්‍රත්‍යගණන සංචිතය

ප්‍රත්‍යගණන සංචිතය දේපළ, පිරියත සහ උපකරණ නැවත තක්සේරු කරන ප්‍රමාණයන්ගෙන් සමන්විත වේ.

3.8 ප්‍රදාන සහ සහනාධාර

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රදාන සහ සහනාධාර ඒවායේ සාධාරණ අගය මත හඳුනාගනු ලැබේ. ප්‍රදානය හෝ සහනාධාරය වියදමකට අදාළ වන විට එය ක්‍රමානුකූල පදනමක් මත හිලව් කිරීමට අදහස් කරන වියදම් සමඟ එය ගැලපීමට අවශ්‍ය කාල සීමාව තුළ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

වත්කම්වලට අදාළ ප්‍රදාන සහ සහනාධාර සාමාන්‍යයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙන් විලම්භනය කරනු ලබන අතර වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය මත විස්තීරණ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය (සම්බන්ධිතයි)

3.9 ආදායම හඳුනාගැනීම

3.9.1 දායකත්ව / ආදායම් මූලාශ්‍ර

සීමා කරන ලද අරමුදල්වලින් ලැබෙන ආදායම විස්තීරණ ආදායම් ප්‍රකාශයන්හි හඳුනාගනු ලබන්නේ අරමුදල් ලැබීමේ සියලු කොන්දේසිවලට අනුකූලව කටයුතු කර ඇති බවට සහතිකයක් ඇති විට සහ හිලව් කිරීමට අපේක්ෂා කරන අදාළ වියදම් අයකර ඇති විට සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට අයකර ඇති විට පමණි. භාවිතයට නොගත් අරමුදල් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙන යනු ලැබේ.

අනෙකුත් සියලුම ආදායම් හඳුනා ගන්නේ එවැනි අරමුදල් භාවිතා කිරීමට පදනමට නීත්‍යානුකූලව හිමිකම් ඇති විට සහ ප්‍රමාණයන් ගණනය කළ හැක විට ය.

3.9.2 ආදායම

උපයන පොළිය උපචිත පදනම මත හඳුනා ගැනේ.

දේපළ, පිරියත සහ උපකරණ අපහරණය කිරීමේ ශුද්ධ ලාභ සහ අලාභ, අපහරණය කිරීමෙන් ලැබෙන ආදායම, අපහරණය කරන ලද භාණ්ඩයේ ධාරණ අගය සහ ඊට අදාළ ඕනෑම විකුණුම් වියදම් වලින් අඩු කිරීමෙන් පසු විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. අපහරණය කරන ලද වත්කම්වල වටිනාකම ප්‍රාග්ධන සංචිතයෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ. නැවත තක්සේරු කළ වත්කම් සම්බන්ධයෙන්, නැවත තක්සේරු කිරීමේ සංචිත ගිණුමේ ඉතිරිව ඇති ඕනෑම ශේෂයක් විස්තීරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ.

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

3.10 වියදම් හඳුනාගැනීම

පදනමේ මෙහෙයුම් සහ අනෙකුත් ක්‍රියාකාරකම් සිදුකිරීමේ වියදම්, ඒවා දරනු ලබන කාල සීමාව තුළ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත. පදනම පරිපාලනය කිරීමේදී සහ පවත්වාගෙන යාමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ අපේක්ෂිත මට්ටමින් ක්‍රියාත්මක වීමට දරන ප්‍රතිසංස්කරණය කිරීමේ සහ නඩත්තු කිරීමේ අනෙකුත් වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කර විස්තීරණ ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

සටහන **4** - දේපල, පිරියත සහ උපකරණ

සටහන **4.1** - දේපල, පිරියත සහ උපකරණ

	2024.01.01 දිනට ශේෂය රු.	පෙර වර්ෂයන්ට අදාල ගැලපුම් රු.	එකතු කිරීම් රු.	ප්‍රත්‍යාගණනය රු.	බැහැර කිරීම් / ආපසු හැරවීම් රු.	**2024.12.31** දිනට ශේෂය රු.
පිරිවැය / තක්සේරුව						
මෝටර් රථ (ගිලන් රථ-අදියර 1)	247,925,000		-	-	-	247,925,000
මෝටර් රථ (ගිලන් රථ-අදියර 2 සහ 3)	1,224,899,997		-	303,480,000	(780,599,997)	747,780,000
තොරතුරු තාක්ෂණ උපකරණ	131,622,789		76,849,756	-	-	208,472,546
ගෘහ භාණ්ඩ සහ උපකරණ	30,361,194		262,432	-	-	30,623,626
වෛද්‍ය උපකරණ	206,442,488		62,164,275	-	-	268,606,763
මෘදුකාංග	29,149,008	(6,601,851)	-	-	-	22,547,157
මෙවලම්	7,908,459		1,060,890	-	-	8,969,348
කාර්යාල උපකරණ	11,915,952		7,653,085	-	-	19,569,037
කෙරීගෙන යන වැඩ - මෘදුකාංග	-	6,601,851	-	-	-	6,601,851
	1,890,224,887	-	147,990,438	303,480,000	(780,599,997)	1,561,095,328

	2024.01.01 දිනට ශේෂය රු.	පෙර වර්ෂයන්ට අදාල ගැලපුම්	වර්ෂය සඳහා අය කිරීම රු.	ආපසු හැරවීම්	බැහැර කිරීම් රු.	**2024.12.31** දිනට ශේෂය රු.
පිරිවැය / තක්සේරුව මත ක්ෂය වීම						
මෝටර් රථ (ගිලන් රථ-අදියර 1)	51,767,336		41,413,869	-	-	93,181,205
මෝටර් රථ (ගිලන් රථ-අදියර 2 සහ 3)	730,534,570		175,563,698	-	(780,599,997)	126,452,444
තොරතුරු තාක්ෂණ උපකරණ	113,535,040		18,369,178	-		138,460,542
ගෘහ භාණ්ඩ සහ උපකරණ	25,133,512		3,765,058	-		27,790,778
වෛද්‍ය උපකරණ	120,124,034	1,745,154	23,965,569	-	-	149,853,349
මෘදුකාංග	21,831,644		2,178,894	-		22,343,883
මෙවලම්	6,761,479		1,385,443	-		7,630,999
කාර්යාල උපකරණ	7,871,104	41,322	2,232,894	-		10,220,638
කෙරීගෙන යන වැඩ - මෘදුකාංග	-	-			-	-
	1,077,558,719	1,786,475	268,874,603	-	(780,599,997)	575,933,838

	2024.12.31 දිනට ශේෂය රු.	**2023.12.31** දිනට ශේෂය රු.
පිරිවැය / තක්සේරුව මත වත්කම්වල ශුද්ධ පොත් වටිනාකම		
මෝටර් රථ (ගිලන් රථ-අදියර 1)	154,743,795	196,157,664
මෝටර් රථ (ගිලන් රථ-අදියර 2 සහ 3)	621,327,556	494,365,428
තොරතුරු තාක්ෂණ උපකරණ	70,012,004	18,087,750
ගෘහ භාණ්ඩ සහ උපකරණ	2,832,848	5,227,683
වෛද්‍ය උපකරණ	118,753,414	86,318,453
මෘදුකාංග	203,274	7,317,364
මෙවලම්	1,338,349	1,146,979
කාර්යාල උපකරණ	9,348,398	4,044,848
කෙරීගෙන යන වැඩ - මෘදුකාංග	6,601,851	-
	985,161,489	812,666,168

සටහන **4.2** - මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය

අදියර 2 හි මෝටර් වාහන (ගිලන් රථ) 2024 ඔක්තෝම්බර් 31 වන දිනට "කෙයාර් ඩ්‍රයිව් වරලත් තක්සේරුකරණ සහ උපදේශන (පුද්ගලික) සමාගම" විසින් විවෘත වෙළඳපල තුල පවත්නා අගයන් මත පදනම්ව ස්වාධීන තක්සේරු වාර්තාවක් ලබා දෙන ලදී. විවෘත වෙළඳපල වටිනාකම් ක්‍රමය සමාන හෝ සැසඳිය හැකි වත්කම්, වගකීම් ඇතුළත් වෙළඳපල ගනුදෙනු මගින් ජනනය කරන ලද මිල ගණන් සහ අනෙකුත් අදාළ තොරතුරු මෙහිදී භාවිතා කරයි.

	අදියර 1	**අදියර 2**	**අදියර 3**
මෝටර් රථවල වටිනාකම 2024/01/01	247,925,000	780,599,997	444,300,000
ප්‍රත්‍යාගණනයෙන් ලැබෙන වටිනාකම	-	303,480,000	-
මෝටර් රථවල වටිනාකම 2024/12/31	247,925,000	303,480,000	444,300,000

NOTE 4.3 - දේපළ, පිරියත සහ උපකරණ සඳහා වසරට අදාල ගැලපීම්

වෛද්‍ය උපකරණ සහ කාර්යාල උපකරණ සඳහා ක්ෂයවීම් ගණනය කිරීම්වල තාක්ෂණික දෝෂ හඳුනා ගැනීමෙන් පසුව, වත්මන් කාලපරිච්ඡේදය තුළ මෙම දෝෂ නිවැරදි කිරීම සඳහා පෙර වර්ෂයේ ගැලපීම් සිදු කර ඇත.

	2022	**2023**
වෛද්‍ය උපකරණ සඳහා ක්ෂයවීම්වල වටිනාකම	163,401	1,581,753
කාර්යාල උපකරණ සඳහා ක්ෂයවීම්වල වටිනාකම	-	41,322
	163,401	1,623,075

වැටීම් හඳුනාගැනීමේ පද්ධතියේ වටිනාකම, කෙරීගෙන යන වැඩ - තාක්ෂණික මෘදුකාංගය ලෙස නැවත වර්ගීකරණය කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

	2024.12.31 රු.	2023.12.31 රු.
සටහන 5 - තොගය		
ඖෂධ, සහ වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍ය - (සටහන (අ))	101,466,959	132,667,405
ලිපි ද්‍රව්‍ය සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය	40,506,659	5,128,319
විදුලි ජනන යන්ත්‍රය සඳහා ඩීසල් තොගය	505,250	-
	142,478,868	137,795,724

සටහන (අ) : මෙම අගය, ගිලන්රථ 322 ක් සඳහා දිවයින පුරා බෙදා හරිනු ලබන ඖෂධ, වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍ය, වෛද්‍ය උපකරණ සහ අදාළ වෙනත් ද්‍රව්‍යයන් නියෝජනය කරයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබුණු රුපියල් 7,674,108 වටිනා පරිභෝජන ද්‍රව්‍ය තොගද මෙහි ඇතුළත් වේ.

	2024.12.31 රු.	2023.12.31 රු.
සටහන 6 - අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ		
ආරක්ෂක තැන්පතු	11,832,000	9,872,250
අත්තිකාරම්	46,642	20,000
පෙරගෙවුම් සහ ලැබිය යුතු මුදල්	76,604,740	81,386,911
ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු මුදල් - (සටහන 6.1)	352,591,526	330,091,526
	441,074,909	421,370,689
සටහන 6.1- ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු මුදල්		
වසර මුලදී ශේෂය	330,091,526	330,091,526
ශ්‍රී ලංකා රජයෙන් වර්ෂය තුළ ලැබුණු අරමුදල්	-	-
සීමා කරන ලද අරමුදල් වෙත මාරු කිරීම් -ඉන්දීය රජයේ ප්‍රදාන (සටහන 9)	-	-
මහා භාණ්ඩාගාරය වෙත භාර දුන් නමුත් වර්ෂය තුළ නොලැබුණු පරිත්‍යාගශීලීන්ගෙන් ලද අරමුදල්	22,500,000	
වසර අවසානයේ ශේෂය	352,591,526	330,091,526
සටහන 7 - මුදල් සහ මුදල් සමාන දෑ		
ලංකා බැංකුව - ශ්‍රී ලංකා රුපියල් ගිණුම්	558,748,820	410,629,564
ලංකා බැංකුව - ඇමෙරිකානු ඩොලර් ගිණුම	540,722,334	599,328,713
	1,099,471,153	1,009,958,277
සටහන 8 - නම් කරන ලද සංචිත - ප්‍රාග්ධන - ඉන්දීය රජයෙන් ලද ප්‍රදාන		
වසර මුලදී ශේෂය	176,627,794	366,170,755
සීමා කරන ලද අරමුදල් වලින් මාරු කිරීම් - ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන - (සටහන 9)	-	-
දේපල, පිරියත හා උපකරණ ක්ෂය වීම	(121,194,577)	(189,542,961)
වසර අවසානයේ ශේෂය	55,433,217	176,627,794

1990 සුව සැරිය පදනම

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

	2024.12.31 රු.	2023.12.31 රු.
සටහන 9 - සීමා කරන ලද අරමුදල් - ඉන්දීය රජයෙන් ලද ප්‍රදාන		
වසර ආරම්භයේ දී ශේෂය	667,751,138	679,434,218
නම් කරන ලද සංචිත වෙත මාරු කිරීම් -ප්‍රාග්ධන- ඉන්දීය රජයෙන් ලද ප්‍රදාන-(සටහන 8)	-	-
විස්තීරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කිරීම් - (සටහන 16)	-	(11,683,080)
වසර අවසානයේ ශේෂය	667,751,138	667,751,138
සටහන 10 - නම් කරන ලද සංචිත- ප්‍රාග්ධන -ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රදාන		
වසර ආරම්භයේ දී ශේෂය	453,880,115	418,940,000
ප්‍රදාන වශයෙන් ලැබුණු ගිලන්රථ	-	-
සීමා කරන ලද අරමුදල් වලින් මාරු කිරීම් - ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන - (සටහන 15)	144,387,494	69,003,115
දේපල, පිරියත සහ උපකරණ ක්ෂය වීම	(102,585,132)	(34,063,000)
පෙර වර්ෂයන්ට අදාල ගැලපුම් - ක්ෂය වීම	(2,750,436)	-
සෞඛ්‍ය අමාත්‍යාංශ සැපයුම් අංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	9,592,643	-
වසර අවසානයේ ශේෂය	502,524,685	453,880,115
සටහන 11 - ප්‍රත්‍යාගණන සංචිතය		
වසර ආරම්භයේ දී ශේෂය	247,925,000	247,925,000
මෝටර් රථවල ප්‍රත්‍යාගණන අතිරික්තය	303,480,000	-
වසර අවසානයේ ශේෂය	551,405,000	247,925,000
සටහන 12 - නම් කරන ලද සංචිත - පරිත්‍යාගශීලීන්ගෙන් ප්‍රාග්ධන ප්‍රදානය		
වසර මුලදී ශේෂය	29,085,500	-
අරමුදලට පරිත්‍යාගශීලීන්ගෙන් එකතු කිරීම්	10,554,208	29,085,500
දේපල, පිරියත සහ උපකරණ - ක්ෂය වීම	(3,255,369)	
පෙර වර්ෂයන්ට අදාල ගැලපුම් - ක්ෂය වීම	(13,813)	
වසර අවසානයේ ශේෂය	36,370,525	29,085,500
සටහන 13 - සේවක ප්‍රතිලාභ		
වසර ආරම්භයේ දී ශේෂය	128,622,431	111,899,625
විස්තීරණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනාගත් වියදම්	22,044,500	22,671,250
වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්	(5,855,125)	(5,948,444)
වසර අවසානයේ ශේෂය	144,811,806	128,622,431
සටහන 14 - වෙනත් ගෙවිය යුතු		
ව්‍යවස්ථාපිත විගණන ගාස්තුව	200,000	200,000
සේවක භාරකාර අරමුදල	1,609,446	1,315,396
සේවක අර්ථසාධක අරමුදල	10,729,642	8,769,307
උපචිත වියදම්	19,586,812	11,700,345
ගෙවිය යුතු වෙනත් සැපයුම්කරුවන් සහ ණය හිමියන්	8,461,960	41,475,508
	40,587,860	63,460,556
සටහන 15 - සීමා කරන ලද අරමුදල්- නව ගිලන් රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		
වසර ආරම්භයේ දී ශේෂය	102,806,885	124,810,000
ප්‍රාග්ධන වියදම් සඳහා ලද අරමුදල්	122,000,000	47,000,000
නම් කරන ලද සංචිත වෙත මාරු කිරීම්-ප්‍රාග්ධන- ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රදාන-(සටහන 10)	(144,387,494)	(69,003,115)
වසර අවසානයේ ශේෂය	80,419,391	102,806,885

	2024.12.31 දිනට ශේෂය රු.	2023.12.31 දිනට ශේෂය රු.
සටහන 16 - ලැබූ අදායම්		
ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු මුදල්වලට අනුව හඳුනාගත් ආදායම	2,279,335,850	2,184,550,000
ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ඖෂධ සහ වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍යවලට අනුව හඳුනාගත් ආදායම	7,674,108	27,211,835
ඉන්දියානු රජයෙන් ලැබෙන ප්‍රදානවලට අනුව හඳුනාගත් ආදායම-(සටහන 9)	-	11,683,080
ජපන් රජයෙන් ලද ඉන්ධන දීමනාව අනුව හඳුනාගත් ආදායම	137,818,582	
	2,424,828,539	2,223,444,915

1990 සුව සැරිය පදනම — පිටුව 15

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

	2024.12.31න් අවසන් වසර සඳහා රු.	2023.12.31න් අවසන් වසර සඳහා රු.
සටහන 17 - සෘජු වියදම්		
ගිලන් රථ ඔක්සිජන් වියදම	2,388,680	2,724,535
ගිලන් රථ සැපයුම්	76,267,366	63,562,253
කාර්ය මණ්ඩල වැටුප්	519,868,198	552,978,882
සේවක අර්ථසාධක අරමුදල	75,238,400	66,357,466
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	18,809,598	16,589,366
අතිකාල දීමනා	391,159,749	378,468,586
ගමන් වියදම් සහ වෙනත් දීමනා	205,534,996	85,010,857
ඉන්ධන වියදම්	334,265,940	346,561,044
ඉන්ධන කාඩ්පත් ගාස්තු - NTB	955,530	1,559,283
අලුත්වැඩියාව සහ නඩත්තුව	459,582,816	302,227,136
කාර්ය මණ්ඩල නිල ඇඳුම්	1,870,324	103,521
වාහන රක්ෂණය	69,591,466	57,747,896
දුරකථන ගාස්තු	34,610,259	27,355,829
	2,190,143,321	1,901,246,655

	2024.12.31න් අවසන් වසර සඳහා රු.	2023.12.31න් අවසන් වසර සඳහා රු.
සටහන 18 - වක්‍ර වියදම්		
ප්‍රචාරණ වියදම්	244,779	1,279,669
බැංකු ගාස්තු	439,625	328,340
විදුලි ගාස්තු	9,074,229	9,597,316
ඉන්ධන කාඩ්පත් ගාස්තු	347,716	295,151
ඉන්ධන වියදම් - වෙනත්	5,629,113	4,805,483
සාමාන්‍ය පරිපාලන වියදම්	2,241,082	1,073,723
කම්කරු වන්දි රක්ෂණය	680,990	701,017
පුද්ගලික අනතුරු රක්ෂණය	1,902,934	1,881,987
අන්තර්ජාල සහ රූපවාහිනී වියදම්	50,244,093	62,285,068
නීතිමය ගාස්තු	1,994,640	717,500
දේශීය ගමන් වියදම් සහ ප්‍රවාහන වියදම්	38,541,448	26,185,910
නවාතැන් සහ ආහාර වියදම්	1,742,700	1,035,675
ක්ෂය වීම	62,131,813	45,239,334
කාර්යාල පිරිසිදු කිරීමේ වියදම්	2,018,168	1,814,999
කාර්යාල නඩත්තු සහ අනෙකුත් කාර්යාල වියදම්	344,405	1,105,345
සේවා ගාස්තු	2,954,484	2,014,429
තැපැල් ගාස්තු	962,112	360,477
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය වියදම්	1,941,059	1,163,052
විගණන ගාස්තු	243,552	227,010
වෘත්තීය ගාස්තු	29,225,618	26,473,557
කුලී වියදම්	30,263,584	21,860,662
ආරක්ෂක ගාස්තු	5,050,382	4,771,356
මෘදුකාංග සහාය ගාස්තු	21,325,135	12,155,415
කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ වියදම්	147,254	-
කාර්ය මණ්ඩල සුබසාධන වියදම් සහ කාර්යාල පරිභෝජන භාණ්ඩ	4,517,323	3,519,095
පුහුණු වියදම්	31,950,928	12,314,163
GPS වියදම	10,102,650	10,030,286
තොරතුරු තාක්ෂණ සහ අදාළ වියදම් සහ වාර්ෂික නඩත්තු වියදම්	10,758,428	3,852,312
කාර්යාල අලුත්වැඩියා වියදම්	-	132,585
කාර්ය මණ්ඩල විශ්‍රාම පාරිතෝෂිකය	22,044,500	22,671,250
බාහිරින් ලබාගත් කාර්ය මණ්ඩල සඳහා පිරිවැය	37,549,468	37,344,212
ජංගම දුරකථන සහ උපාංග නඩත්තු කිරීම	-	1,189,275
මුද්දර ගාස්තු	132,602	202,237
ජල ගාස්තු	323,709	307,203
ඉලෙක්ට්‍රොනික උපකරණ රක්ෂණය	538,511	332,517
උපකරණ නඩත්තු කිරීම	135,519	1,109,404
ගිනි රක්ෂණය - ව්‍යාපාර පරිශ්‍ර රක්ෂණය	473,599	361,755
	388,218,153	320,738,766

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

සටහන 19 - වෙනත් ක්‍රියාකාරකම් වලින් ඉපැයූ ආදායම

	2024.12.31න් අවසන් වසර සඳහා රු.	2023.12.31න් අවසන් වසර සඳහා රු.
විදේශ විනිමය හුවමාරු ලාභය	(62,795,960)	(67,878,457)
සුන්බුන් විකුණුම් සහ වෙනත් ආදායම්	3,175,819	1,169,745
පරිත්‍යාග	262,242,231	324,522,847
ගිලන්රථ බැහැර කිරීම මත ලාභය	-	6,048,902
	202,622,090	263,863,037

සටහන 20 - මූල්‍ය ආදායම

ඉතුරුම් ගිණුමේ පොලී ආදායම	4,189,580	4,607,563
	4,189,580	4,607,563

සටහන 21 - ප්‍රාග්ධන බැදීම්

මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට අවශ්‍ය ප්‍රධාන ප්‍රාග්ධන බැදීම් කිසිවක් නොතිබුණි

සටහන 22 - අවිනිශ්චිත වගකීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන අවිනිශ්චිත වගකීම් කිසිවක් නොතිබුණි.

සටහන 23 - ශේෂ පත්‍රයේ දිනයට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම අවශ්‍ය වන වෙනත් සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදු නොවීය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	එමර්ඩ්/බී/1990එස්එෆ්/01/2024/31	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2025 අප්‍රේල් 25 දින

සභාපති,
1990 සුවසැරිය පදනම

1990 සුවසැරිය පදනමේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සුවසැරිය පදනමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සුවසැරිය පදනමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සුවසැරිය පදනමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

පදනමේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මඟින් නිර්දේශිත ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සඳහා නිර්දේශිත ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සුවසැරිය පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති හා විධිවිධානවලට යොමුව	**නිරීක්ෂණය**
(අ) 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනත	
(i) පනතේ 7 (අ) (II) උප වගන්තිය	සෞඛ්‍යය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්කළ යුතු වුවද 2024 සැප්තැම්බර් සිට ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි.
(ii) පනතේ 18 (5) සහ 25 (1) උප වගන්ති	මණ්ඩලය විසින් අරමුදලින් මුදල් ගෙවීම සම්බන්ධයෙන් රීති සකස්කළ යුතු අතර 25(1) උප වගන්තියේ සඳහන් කරුණු සම්බන්ධයෙන්ද රීති සකස් කරනු ලැබිය හැකිය.එසේ පදනම විසින් සාදනු ලබන සෑම රීතියක්ම අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ආ) 2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා ජීවිකේ ඊඑම්ආර්අයි ලංකා (පුද්ගලික) සමාගම (GVK EMRI Lanka (Private) Ltd) ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම හා 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 26 (ඇ) උප වගන්තිය	2024 දෙසැම්බර් 31 දිනට පදනමට ලැබිය යුතු ශේෂය රු. 441,074,908ක් වූ අතර ඉන් රු.352,591,526 ක් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු පුනරාවර්තන වියදම් විය. එම ශේෂය තුළ පවතින 2019 වර්ෂයේ සිට පැවත එන රු.330,091,526 ක ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණු අතර ශේෂ සනාථ කිරීමක්ද විගණනයට ඉදිරිපත් නොවුණි.
(ඇ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත	
(i) 38 (1) උප වගන්තියේ (ඇ) ඡේදය	මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	(ii) 38 (2) උප වගන්තිය	පනතේ 38 (1) උප වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාර සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.
	(iii) 40 (1) උප වගන්තිය	විගණනය කරනු ලබන අස්ථිත්වයෙහි අභ්‍යන්තර විගණනය සිදුකිරීම සඳහා එම අස්ථිත්වයෙහි පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවත් පදනම ආරම්භයේ සිට මේ දක්වාම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.
(ඈ)	රාජ්‍ය ව්‍යාපාර හැසිරීම පිළිබඳ 2021 නොවැම්බර් 16 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 3.6 ඡේදය	උපාය මාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලසුම් මත පදනම්ව ඵලදායී කාර්යසාධන ඇගයුම් පද්ධතියක් හඳුන්වා දී සේවකයා හා කළමනාකාරීත්වය අතර ප්‍රධාන කාර්යසාධන දර්ශක ක්‍රියාත්මක විය යුතුය. එක් එක් සේවකයාගේ ඵලදායීතාවය ආසන්න නිලධාරියා විසින් ඇගයීමට ලක්කළ යුතු වුවද, පදනම විසින් නිලධාරීන් සඳහා ඵලදායී කාර්යසාධන ඇගයුමක් සිදුකර නොතිබුණි. එසේම සුවසැරිය පදනමේ කාර්ය මණ්ඩලයට අදාළ වැටුප් ව්‍යුහය 2019 අගෝස්තු 01 දින සිට අනුමත කර තිබූ නමුත් වාර්ෂික වැටුප් වර්ධක ව්‍යුහයක් දක්වා නොතිබුණි.
(ඉ)	2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහය සහ අත්පොත	
	(i) 2 වන පරිච්ඡේදයේ 2.3 ඡේදය	පදනමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සමඟ වාර්ෂික අයවැය ලේඛනයද ඇතුළත් උපාය මාර්ගික සැලැස්මක් සකස් කර එම සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. අනුමත නොකරන ලද ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළද එම සැලැස්ම මාර්ගෝපදේශය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.
	(ii) 5 වන පරිච්ඡේදයේ 3 ඡේදය	අයවැයගත ආදායම් ප්‍රකාශයක්, අයවැයගත මූල්‍ය තත්ත්වය දක්වන වාර්තාවක්, අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් හා ප්‍රාග්ධන වියදම් අයවැයක් වාර්ෂික අයවැය ලේඛනය පිළියෙළ කිරීමේදී ඇතුළත් කළ යුතු වුවද මාර්ගෝපදේශය ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

(ඊ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 4.2 ඡේදය	අස්ථිත්වයක් විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු අතර අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කළ යුතු වුවද, පදනම විසින් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ සමාලෝචිත වර්ෂය සඳහා පමණක් වූ අතර එය තුළ ද ප්‍රාග්ධන වත්කම් ප්‍රසම්පාදන පිළිබඳව සඳහන් කර නොතිබුණි.
(උ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 880	රජයේ මුදල්, බඩු බාහිරාදිය භාර ගැනීම හෝ බාරව සිටීම, එසේ නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් පදනමේ ඇප තැබිය යුතු නිලධාරින් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2024 දෙසැම්බර් 31 දිනට පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 1,992 ක් වු අතර එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 1152 ක් වූයෙන් කාර්ය මණ්ඩල ඌනතාවය 840 ක් විය. තවද අනුමත තනතුරු 42 න් තනතුරු 10 ක් පුරප්පාඩුව පැවති අතර එම තනතුරු 10 ට අදාළ කාර්ය මණ්ඩලය 24 ක් විය. ඒ අතරින් අනුමත පළාත් භාර නිලධාරීන් සහ තත්ත්ව විශ්ලේෂක තනතුරු සංඛ්‍යාව පිළිවෙලින් 9ක් හා 5ක් වූ අතර එම තනතුරු පිළිවෙලින් 2018 සහ 2022 වර්ෂවල සිට පුරප්පාඩුව පැවතිණි. එසේම සහකාර සැපයුම් දාම කළමණාකරු තනතුරද 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතිණි.

(ආ) 2018 අංක 18 දරන සුවසැරිය පදනම පනතේ 4 (ඇ) වගන්තිය ප්‍රකාරව තෑගි හෝ පරිත්‍යාග ලබාගැනීම සඳහා පදනමට බලතල හිමිව තිබුණද භාණ්ඩාගාර ලේකම්ගේ 2022 මාර්තු 30 දිනැති අංක FP/01/01/05/09-2022 දරන පදනමේ සභාපති අමතන ලද ලිපිය ප්‍රකාරව, පදනම වෙත ලැබෙන ත්‍යාග/ප්‍රධාන ගිණුම්ගත කළ යුතු ආකාරය පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති 2022 ජුලි 08 දිනැති අංක SA/MAA/GRG/01 දරන මාර්ගෝපදේශය ප්‍රකාරව පදනමට ලබාදෙන පරිත්‍යාග ප්‍රථමයෙන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල ගිණුමට මාරුවනු පිණිස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු අතර පසුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමෙන් අනතුරුව නියමිත අක්මුදල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කළ යුතු වුවත් 2024 වර්ෂය තුළ ලැබුණු පරිත්‍යාග මුදල් රු.22,042,231 ක් යථෝක්ත මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) සුවසැරිය පදනම විසින් ග්ලූකෝස් හා ලැක්ටේට් මට්ටම් හඳුනාගැනීමේ විශේෂාංග සහිත වැටීම් හඳුනාගැනීම සඳහා පැලඳිය හැකි සංවේදකයක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ පුද්ගලික සමාගම හා හොංකොං හි ලියාපදිංචි සීඅයිආර්කිව් ටෙක්නොලජීස් (CIRQ Technologies) ආයතනය සමඟ ගිවිසුම්ගතවී තිබුණි. මෙම ව්‍යාපෘතිය වැටීම් හඳුනාගැනීමේ සංවේදක මෘදුකාංගය නිර්මාණය කිරීම, ශරීරයේ ග්ලූකෝස් මට්ටම හා ලැක්ටේට් මට්ටම් හඳුනාගැනීමේ උපකරණයක් නිර්මාණය කිරීම හා උපකරණය හා වැටීම් හඳුනාගැනීම් සංවේදක යන දෙකම ඇතුළත් කර පැළඳිය හැකි උපකරණයක් සංවර්ධනය කිරීම යනුවෙන් අදියර 3 කින් සමන්විත විය. පදනම රු.6,601,850 ක් වැයකර සංවෙදක මෘදුකාංගය නිර්මාණය කර වර්ෂ 2ක් ඉක්මවා තිබුණද අනෙකුත් කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකි වීම තුළ මෙම ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණු බැවින් එය නිශ්කාර්ය වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) පදනම විසින් කුලී පදනම මත සිය ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලෙහි පළමු, දෙවන , තෙවන සහ පස්වන මහලේ කොටසක් පදනමේ කටයුතු සඳහා භාවිතා කරනු ලබන අතර ගෙවනු ලබන කුලී මුදල සඳහා තක්සේරු වාර්තාවන් ලබාගන්නා ලෙස 2024 මාර්තු 29 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව ලබාගන්නා ලද තක්සේරු වටිනාකම්වලට වඩා වැඩි වටිනාකමක් ක්‍රියාත්මක කරන ලද ගිවිසුම් අනුව එකඟ වී තිබූණු අතර මාස 12 ක ගිවිසුම්ගත කාලයක් සැලකීමේදී තක්සේරු වටිනාකම ඉක්මවා රු.මිලියන 05ක බදු වියදමක් සුවසැරිය පදනම දරා තිබුණි. තවදුරටත් ගොඩනැගිල්ලේ හිමිකරු රජයේ තක්සේරු වටිනාකමට එකඟතාවය පළකර නොතිබුණු අතර ගිවිසුම්ගත කුලී මුදලද ඉක්මවන වෙනත් තක්සේරු වාර්තාවක් හිමිකරු විසින් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද ගොඩනැගිල්ලේ කුලී වටිනාකම පිළිබඳව එකඟතාවයකින් තොරව හා වාර්තාවේ දින වන විට දෙපාර්ශවය අතර එළඹි ගිවිසුමක් නොමැතිව පදනම සිය ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන බව විගණනයේදී නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 835 (2) රෙගුලාසිය අනුව ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේදී ආයතන ප්‍රධානියා ප්‍රධාන තක්සේරුකරු විමසිය යුතු වන අතර ප්‍රධාන තක්සේරුකරුගේ තීරණය බාර ගන්නට ප්‍රධානියාට නුපුළුවන් නම්, එම ගොඩනැගිල්ල කුලියට ගන්නා ආයතනය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත තීරණයක් සඳහා එම කාරණය යොමු කළ යුතු වුවද පදනම ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි.

(ඉ) ගිලන්රථ සඳහා නව ටයර් යෙදීමෙන් පසු භාවිතාකරන ලද ටයර් අපහරණය සඳහා නැවත ගෙන්වා ගබඩාකර තිබුණු අතර ඇතැම් ටයර් ඉතා අධික ලෙස ගෙවී තිබුණු බවත් ඇතැම් ටයර්වල කම්බි නිරාවරණය වී අනාරක්ෂිතව පැවති බවත් නිරීක්ෂණය වූයෙන් මෙය ආරක්ෂිත සායනික පරිසරයක් තුළ පූර්ව රෝහල් ප්‍රතිකාර ලබාදීමේදී සුදුසු නොවන තත්ත්වයක් විය. තවද මෙම ටයර් සත්‍ය වශයෙන්ම ගිලන්රථවලින් ඉවත්කරන ලද ටයර්මද යන්න ගණනයේදී බැහැරකල නොහැකි විය. එසේම 2023 හා 2024 වර්ෂයන් තුළ නව ටයර් 2299ක් ගිලන්රථ සඳහා නිකුත් කර තිබූණු අතර භාවිතයෙන් ඉවත්කරන ලද ටයර් සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් එම කාල පරිච්ඡේදය තුළ භාවිතකරන ලද ටයර් 1068 ක් පමණක් නැවත පදනම වෙත බාරදී තිබූණි. 2022 වර්ෂයෙන් පසුව. මෙම ටයර් අපහරණය තුළින් ආදායමක් උපයා ගැනීමට පදනම විසින් කටයුතු කර නොතිබුණු අතර ඒවා විනාශකිරීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබුණද ඒ සම්බන්ධයෙන් විධිමත් වාර්තා පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඊ) පදනම විසින් 2023 වර්ෂයේදී ජංගම දුරකථන 200 ක් මිලදී ගැනීමට වෙළදපල මිල සැඳහුම් ක්‍රමය යොදාගනිමින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර තිබුණි. මේ සඳහා ආයතන 03 කින් මිල ගණන් කැඳවූ බවත් එක් සැපයුම්කරුවෙකු පමණක් ලංසු මිල ගණන් ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කළද ආයතන 03කින් වෙළදපල මිල කැඳවුම් සිදු කළ ආකාරය පිළිබඳව විගණනයට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. එසේම විවිධ මිලගණන් යටතේ විවිධ මාදිලි සහිත පුළුල්

ජංගම දුරකථන වෙළඳපල තුළ සැපයුම්කරුවන් විශාල ප්‍රමාණයක් පැවතියදී එක් සැපයුම්කරුවෙකු පමණක් ලංසු මිල ඉදිරිපත් කිරීමත්, සන්සංදනයකින් තොරව එම තනි ලංසුව පමණක් සැළකිල්ලට ගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව ඇගයීම් සිදුකර සමාලෝචිත වර්ෂයේදී රු.10,472,500 ක් වූ මිලකට පදනම විසින් මෙම ප්‍රසම්පාදනය සිදු කර තිබුණි. එබැවින් අවම පිරිවැයකින් ගුණාත්මක භාණ්ඩ මිලදී ගැනීම කෙරෙහි පදනම අවධානය යොමුකර නොතිබුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
වැඩබලන විගණකාධිපති

1990 සුව සැරිය පදනම

දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	31.12.2024 දිනට රු.	31.12.2023 දිනට රු.	31.12.2022 දිනට රු.	31.12.2021 දිනට රු.	31.12.2020 දිනට රු.	31.12.2019 දිනට රු.
වත්කම්						
ජංගම නොවන වත්කම්						
දේපළ, පිරියත හා උපකරණ	985,161,489	812,666,168	1,032,711,371	571,997,088	753,879,965	945,421,940
මුළු ජංගම නොවන වත්කම්	985,161,489	812,666,168	1,032,711,371	571,997,088	753,879,965	945,421,940
ජංගම වත්කම්						
තොගය	142,478,868	137,795,724	54,947,491	57,357,699	38,157,963	18,277,233
අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	441,074,908	421,370,688	363,470,864	377,421,345	433,261,152	365,949,902
මුදල් සහ මුදල් හා සමාන දෑ	1,099,471,153	1,009,958,277	845,703,463	481,241,344	580,428,889	641,854,325
මුළු ජංගම වත්කම්	1,683,024,930	1,569,124,689	1,264,121,818	916,020,388	1,051,848,004	1,026,081,460
මුළු වත්කම්	2,668,186,419	2,381,790,857	2,296,833,189	1,488,017,476	1,805,727,969	1,971,503,400
අරමුදල් සහ වගකීම්						
සමුච්චිත අරමුදල						
නම් කරන ලද සංචිත - ප්‍රාග්ධනය - ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන	55,433,217	176,627,794	366,170,755	561,417,085	743,467,107	945,421,940
සීමා කරන ලද අරමුදල් - ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන	667,751,138	667,751,138	679,434,218	813,605,704	932,975,592	947,583,918
නම් කරන ලද සංචිත -ප්‍රාග්ධනය- ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රදාන	502,524,685	453,880,115	418,940,000	-	-	-
ප්‍රත්‍යාගණන සංචිතය	551,405,000	247,925,000	247,925,000	-	-	-
නම් කරන ලද සංචිත - පරිත්‍යාගශීලීන්ගෙන් ප්‍රාග්ධන ප්‍රදානය	36,370,525	29,085,500	-	-	-	-
සමුච්චිත අතිරික්තය / (හිඟය)	566,382,797	511,631,438	241,701,344	(51,365,905)	-	-
සීමා කරන ලද අරමුදල් - පරිත්‍යාගශීලීන්ගෙන් ලද ප්‍රදාන	22,500,000	-	-	-	-	-
මුළු සමුච්චිත අරමුදල	2,402,367,362	2,086,900,985	1,954,171,317	1,323,656,884	1,676,442,699	1,893,005,858
ජංගම නොවන වගකීම්						
සේවක ප්‍රතිලාභ	144,811,806	128,622,431	111,899,625	87,832,625	62,356,750	36,439,375
මුළු ජංගම නොවන වගකීම්	144,811,806	128,622,431	111,899,625	87,832,625	62,356,750	36,439,375
ජංගම වගකීම්						
වෙනත් ගෙවීම්	40,587,860	63,460,556	105,952,247	76,527,967	65,538,991	42,058,167
සීමා කරන ලද අරමුදල් - නව ගිලන් රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	80,419,391	102,806,885	124,810,000	-	-	-
අතිරික්ත ශේෂයන්	-	-	-	-	1,389,529	-
මුළු ජංගම වගකීම්	121,007,251	166,267,441	230,762,247	76,527,967	66,928,520	42,058,167
මුළු වගකීම්	265,819,057	294,889,872	342,661,872	164,360,592	129,285,270	78,497,542
මුළු සමුච්චිත අරමුදල සහ වගකීම්	2,668,186,419	2,381,790,857	2,296,833,189	1,488,017,475	1,805,727,969	1,971,503,400

1990 සුව සැරිය පදනම

විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශය	31.12.2024	31.12.2023	31.12.2022	31.12.2021	31.12.2020	31.12.2019
	දිනෙන් අවසන් වූ වසර සඳහා රු.	දිනෙන් අවසන් වූ වසර සඳහා රු.	දිනෙන් අවසන් වූ වසර සඳහා රු.	දිනෙන් අවසන් වූ වසර සඳහා රු.	දිනෙන් අවසන් වූ වසර සඳහා රු.	දිනෙන් අවසන් වූ වසර සඳහා රු.
මෙහෙයුම් ආදායම						
ලැබු අදායම්	2,424,828,539	2,223,444,915	2,183,887,447	2,105,294,975	1,839,083,107	1,630,918,205
මුළු මෙහෙයුම් ආදායම	2,424,828,539	2,223,444,915	2,183,887,447	2,105,294,975	1,839,083,107	1,630,918,205
මෙහෙයුම් වියදම්						
සෘජු වියදම්	(2,190,143,321)	(1,901,246,655)	(1,964,369,430)	(1,959,096,604)	(1,685,057,475)	(1,435,227,007)
වක්‍ර වියදම්	(388,218,153)	(320,738,766)	(277,683,545)	(274,740,032)	(175,481,846)	(202,191,012)
මුළු මෙහෙයුම් වියදම්	(2,578,361,475)	(2,221,985,420)	(2,242,052,975)	(2,233,836,636)	(1,860,539,321)	(1,637,418,019)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ අතිරික්තය / (හිඟය)	(153,532,935)	1,459,495	(58,165,528)	(128,541,661)	(21,456,214)	(6,499,815)
වෙනත් ආදායම්						
වෙනත් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම	202,622,090	263,863,037	346,466,537	73,233,050	16,860,164	2,436,659
මූල්‍ය ආදායම	4,189,580	4,607,563	4,766,240	3,942,706	4,596,050	4,063,155
මුළු අනෙකුත් ආදායම්	206,811,671	268,470,600	351,232,777	77,175,756	21,456,214	6,499,815
වසර සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)	53,278,735	269,930,094	293,067,249	(51,365,905)	-	-
වෙනත් විස්තීරණ අදායම්						
ප්‍රත්‍යාගණන සංචිතය	303,480,000	-	-	-	-	-
මුළු විස්තීරණ අදායම්	356,758,735	269,930,094	293,067,249	(51,365,905)	-	-